වාර්ෂික වාර්තාව - 2024

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කර ගත් පුරෝගාමී ආයතනයක් වීම.

මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.



ගීතාමනි සී කරුණාරත්න
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

රජයේ ආයුර්වේද රෝහල්,බෙහෙත් ශාලා, ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන්ට මෙන්ම පොදුවේ පාරිභෝගිකයන්ට අවශ්‍ය ආයුර්වේද ඖෂධ නිපදවීම සහ අලෙවි කිරීම පිළිබඳ පුරෝගාමී ආයතනය වශයෙන් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත පනතේ විධිවිධාන ප්‍රකාරව 1969 මැයි 11 දිනැති අංක 14853/3 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් 1969 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද අතර, එය මේ වන විට වසර 55 කට අධික කාලයක් ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය තුල ප්‍රධාන කාර්යභාරය ඉටු කරමින් සිටින පුරෝගාමී ආයතනය වේ.

සභාපතිතුමියගේ පණිවිඩය

මෙම සංස්ථාවට අයත් ඖෂධ නිෂ්පාදනාගාර 02ක්, ඔසු උයන් 03ක්, දිවයින පුරා ක්‍රියාත්මකව පවතින අලෙවි මධ්‍යස්ථාන 16ක් මගින් හා අලෙවි නියෝජිත ජාලයක් මගින් සේවා කටයුතු සිදුකිරීමට පියවර ගෙන ඇත. 2024 වර්ෂයෙදි නිෂ්පාදනය පිරිවැය වටිනාකමට රුපියල් මිලියන 606 වන අතර අලෙවි ආදායම රුපියල් මිලියන 1528 කි. මෙය ප්‍රසස්ථ මට්ටමක ඉලක්ක ලගාකර ගැනීමකි.

ඖෂධ නිෂ්පාදන කටයුතු සිදුකිරීමේදි අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සපයා ගැනීමට විශේෂ අවධානය යොමුකර කටයුතු කර ඇති අතර සංස්ථාව සතු නිකවැරටිය, මැදවච්චිය ඔසු උයන් හා එම ඔසු උයන් අවට ප්‍රදේශවල ඔසු අමුද්‍රව්‍ය එක්රැස් කිරීමටද, ප්‍රාදේශිය වශයෙන් ඔසු අමුද්‍රව්‍ය මිලදි ගැනීමටද කටයුතු කර ඇත.

නිෂ්පාදන අලෙවි කිරීමේ දී මුළු අලෙවියෙන් 75%ක් පමණ රාජ්‍ය අංශය වෙත සිදු කර ඇති අතර පෞද්ගලික අංශයේ අලෙවිය පෙර වර්ෂවලට වඩා වර්ධනය කර ගැනීමටද සමත් වී ඇත.

2024 වර්ෂය තුලදි සිදුකරන ලද සුවිශේෂී කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

නව නිෂ්පාදන ලෙස පාරිභෝගික අවශ්‍යතාවයට අනුකූලව ඖෂධ කිහිපයක් හදුන්වා දීම.

තෝරාගත් පෙති වර්ග,ගුලි වර්ග සහ කැප්සියුල් වර්ග කිහිපයක් BLISTER PACK ආකාරයෙන් ඇසුරුම් කර වෙළඳපලට නිකුත් කිරීම.

- නීරෝගා Ayurveda & Herbal Expo – 2024 සඳහා ක්‍රියාකාරීව සහභාගී වූ අතර එහි දී නිෂ්පාදන ප්‍රවර්ධනය හා නව නිෂ්පාදන හදුන්වා දීමට කටයුතු කිරීම.
- ISO-22000:2018 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය ලබා ගැනීමට අදාල මූලික කටයුතු සිදු කිරීම.
- ප්‍රවර්ධන හා ප්‍රචාරන කටයුතු පුළුල් කිරීම.
- ජාත්‍යන්තර සබඳතා පුළුල් කිරීම.
- ඇසුරුම් අංශය නවීකරණය කිරීම.
- මධ්‍යගත අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය ගබඩා ස්ථාපනය කිරීම.
- ERP පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාල මූලික කටයුතු අවසන් කිරීම.
- CNCI ACHIEVER AWARDS 2024 සම්මානයට පාත්‍ර වීම.

2024 වර්ෂයේ කටයුතු කිරීමේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය, ආයුර්වේද දෙපාර්තමෙන්තුව, පලාත් ආයුර්වේද දෙපාර්තමේන්තු හා අනෙකුත් නිළධාරීන් ලබා දුන් සහයෝගය අගය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය හා නිළධාරින් සමග ඉදිරි ඉලක්කගත කටයුතු සිදු කිරීමට සැලසුම් සහගතව කටයුතු කරමින් සිටින බව සඳහන් කරමි



ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වසර 55 කට අධික කාලයක් පුරා ක්‍රියාත්මක වෙමින් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා අලෙවිකරණයේ පුරෝගාමියා ලෙස කටයුතු කරන අතර 2024 වර්ෂයේදී සාර්ථක ව්‍යාපාරික මෙහෙයුමක් සහ විශිෂ්ඨ සුවසේවා දායකත්වයක් ලබාදීමට හැකිවීම සතුටට කරුණකි.

ධම්මික පාදුක්ක
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය

නාවින්න ප්‍රධාන ඖෂධ නිෂ්පාදනාගාරය, පතිරගොඩ නව ශාකසාර නිෂ්පාදාගාරය, ඔසු උයන් තුනක්, අලෙවි මධ්‍යස්ථාන 16ක් 2024 වර්ෂයේදී ක්‍රියාත්මක වූ අතර අලෙවි නියෝජිත ජාලියේ ශක්තිය ද අලෙවි කටයුතු සඳහා දායකවිය. මෙම කාලවකවානුව තුල සිය මෙහෙවර නොපිරිහෙලා ඉටුකල සභාපතිවරුන්, කළමනාකාර අධ්‍යක්ෂවරුන්, අධ්‍යක්ෂ මණ්ඩලය හා සමස්ථ කාර්ය මණ්ඩලය ඉටුකල කාර්යභාරය සාමාන්‍යාධිකාරීවරයා ලෙස අතිශයින් අගය කරමි. එසේම විෂය අමාත්‍යවරුන්, අමාත්‍යාංශ නිළධාරීන්, ආයුර්වේද කොමසාරිස්වරුන් හා නිලධාරීන් ලබාදුන් සහයද කෘතඥපූර්වකව සිහිපත් කරමි.

2024 වර්ෂයේදී ප්‍රශස්ථ මට්ටමේ නිෂ්පාදන හා අලෙවි ඉලක්ක සපුරාලමින් බදුපෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 183ක් වාර්තා කල අතර ස්වයං මූල්‍ය පදනමක් සහිතව ශක්තිමත් රාජ්‍ය ව්‍යවසායක් ලෙස තවදුරටත් කටයුතු කිරීමට හැකියාව ලැබුණි. රජයේ ආයුර්වේද රෝහල්, බෙහෙත්ශාලා හා වෛද්‍යවරුන් වෙත සිදුකරන රාජ්‍ය අංශයේ අලෙවියට අමතරව මහජනතාව අතර සංස්ථා නිෂ්පාදන ප්‍රචලිත කරමින් පුද්ගලික අංශයේ අලෙවිය වර්ධනය කිරීමටත්, විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය තුලින් ප්‍රචාරන හා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීමටත් විශේෂ අවධානය යොමුකර කටයුතු කරන ලදී.

ජාතික හා ජාත්‍යන්තර තත්ව සහතිකකරණයෙන් යුතුව උසස්ම තත්වයේ ආයුර්වේද ඖෂධ නිපදවමින් මෙරට ජනතාවගේ සුවසෙත සලසන අතරම ඖෂධ හා අනෙකුත් ශාකසාර නිෂ්පාදන අපනයනය කිරීම තුලින් රටට විදේශ විනිමය ඉපයීම උදෙසා ජාතික මෙහෙවරක නිරත මෙම සංස්ථාව ව්‍යාවස්ථාපිත අරමුණු ඉටු කරන අතරම කාලීන අවශ්‍යතාවයන් හඳුනාගෙන පෙර ගමනක යෙදී සිටී. ඉදිරි කටයුතු සඳහා සැමගේ ආශිර්වාදය සහ සහය නිරතුරුව අපේක්ෂා කරමි.

අධ්‍යක්ෂවරු

ගිතාමනී සී කරුණාරත්න මිය



2024.11.03 දින සිට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රධානී ලෙස කටයුතු කරමින් සිටී.

1992 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළුවී ප්‍රාදේශීය ලේකම්, සමාජ සේවා අමාත්‍යාංශය, රාජ්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අතිරේක ලේකම් හා බන්ධනාගාර පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරිය වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ සේවයේ නිලධාරිනියක් ලෙස කටයුතු කර ඇත.

ප්‍රථම උපාධිය රුහුණු විශ්වවිද්‍යාලයේ වාණිජ පීඨය මගින්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ජයවර්ධනපුර පශ්චාත් කළමණාකරණය පිළිබඳ උපාධි ආයතනයෙන්ද ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ, ශ්‍රී ලංකා රක්ෂණහාර අරමුදලේ (NITF), විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ කලමණාකරණ මණ්ඩලයේද, දේශීය වෛද්‍ය විද්‍යාලයේ හා දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස කටයුතු කර ඇත. ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ සභාපති වශයෙන්ද කටයුතු කර ඇත.

වෛද්‍ය එම්.ජේ.මාරසිංහ මයා



රාජ්‍ය සේවයේ වසර 28 ක කාලයක් සේවය කර ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ නිළධාරියෙකු ලෙස විශ්‍රාම ලබා ඇත. ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී ප්‍රථම උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන්ද, ආයුර්වේද රෝහල් පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කැලණිය විශ්ව විද්‍යාලයෙන්ද, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය වයඹ විශ්ව විද්‍යාලයෙන්ද ලබාගෙන ඇති අතර ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ලෙස 2015-2016 කාලය තුල සේවය කර ඇත. කොළඹ මහානගර සභාවේ ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානී ලෙස වසර 8 ක කාලයක් සේවය කර ඇත.

චන්ද්‍රිකා සේනානායක මහත්මිය



2002 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකාවක් ලෙස සේවය ආරම්භ කර ඇත. එහි වසර 07 කට ආසන්න කාලයක් සේවය කර 2008-2010 කාලය තුල වෙළඳ හා අයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකාවක් ලෙස සිය රාජකාරී කටයුතු සිදු කර ඇත. පසු කාලීනව 2010 – 2012 වර්ෂයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක් ලෙස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේද, එම දෙපාර්තමේන්තුවේම 2012 – 2021 කාලය තුල අධ්‍යක්ෂවරියක් වශයෙන් ද සේවය කර ඇති චන්ද්‍රිකා සේනානායක මහත්මිය 2021 වර්ෂයේ සිට මේ දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් වශයෙන් කටයුතු කරනු ලබයි. ඇය 2022.03.02 දින සිට 2024 නොවැම්බර් මස දක්වා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත ලෙස කටයුතු කර ඇත.

චන්ද්‍රිකා සේනානායක මහත්මිය ප්‍රථම උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය මගින් ද, සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කොළඹ විශ්ව විද්‍යාලය මගින් ද, මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය වෙතින්ද ලබා ඇත.

ඕ.වී.චන්දන තිලකරත්න මහතා



2000 වර්ෂයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිළධාරියකු ලෙස රාජ්‍ය සේවයට එක්ව 2001 දී කොටපොල සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස වසර 08 ක් සේවය කොට 2009 දී අකුරැස්ස ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස පත්ව එහි 2021 වසර දක්වා සේවය කර ඇත. 2021 දී දේශීය වෛද්‍ය රාජ්‍ය

අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ලෙස පත්ව 2024.03.28 සිට 2024.12.31 දක්වා ශ්‍රී ලංකා ආයුර්වේද ඖධෂ සංස්ථාවේ අධ්‍යක්ෂ ලෙස සේවය කරන ලදි.

ප්‍රථම උපාධිය (Bsc.Agriculture) රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයෙන් ලබාගෙන ඇත. ප්‍රාදේශීය සංවර්ධනය හා සැළසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධිය (MRDP), කොළඹ විශ්ව විද්‍යාලයෙන්ද, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පස්චාත් උපාධිය (MBA) රුහුණු විශ්ව විද්‍යාලයෙන්ද ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් කලමණාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ((DIPPCA) හා පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමාව (DCAW) ද ලබාගෙන ඇත

ඩබ්ලිව්.ඒ. එච් විමලජීව මහත්මිය



ප්‍රථම උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ හා මුල්‍ය පීඨය මහින්ද පශ්චාත් උපාධිය කැළණි විශ්වවිද්‍යාලය මහින්ද ලබාගෙන ඇති අතර එතුමිය වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය 2005 වසරේදී ලබාගෙන ඇත.

2008 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකාවක් ලෙස සේවය ආරම්භ කර ඇත. එහි වසර 6 කට ආසන්න කාලයක් සේවය කර 2014 - 2017 දක්වා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකාවක් ලෙසද 2017-2020 වර්ෂය දක්වා මුදල් අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරියක ලෙසද සේවය කර ඇත. ඩබ්ලිව්.එම්.ඒ. විමලජීව මහත්මිය මේ දක්වා රාජ්‍ය ආයතන කිහිපයකම අධ්‍යක්ෂකවරියක් ලෙස සේවය කර දායකත්වය ලබා දී ඇත. 2021 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරියක් වශයෙන් කටයුතු කරනු ලබන ඇය 2024 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ භාණ්ඩාගාර නියෝජිත ලෙස කටයුතු කරනු ලබයි.

වෛද්‍යඑස්.ජේ.සී.සමරනායක මහතා



කැලණිය විශ්ව විද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී පස් අවුරුදු උපාධිය (DSAMS) ලබා ඇත. (1993-2000) මීට අමතරව කැලණිය විශ්ව විද්‍යාලයෙන් මනෝ උපදේශනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් PD dip BAC සහ මනෝ උපදේශනය පිළිබඳ ශාස්ත්‍රපති පශ්චාත් උපාධිය (MABCA) සම්පූර්ණ කර ඇත. තවද සබරගමුව විශ්ව විද්‍යාලයේ රෝහල් කළමණාකරණය පිළිබඳ (Msc AHM) විද්‍යාපති පශ්චාත් උපාධිය සම්පූර්ණ කර ඇත.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වෛද්‍ය නිළධාරියකු ලෙස සිය වෘත්තීය සේවාව ආරම්භ කර ඇත.(2002-2010) ඉන් අනතුරුව රජයේ වෛද්‍ය නිලධාරියකු ලෙස සේවයට එක්වූ ඒ මහතා වර්තමානයේදී බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිළධාරියකු වශයෙන් සේවය කරයි.

වෛද්‍ය එම්.ඩී.පී.ජයසුන්දර මහතා



කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයෙන් ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී (BAMS) උපාධිය ලබා ඇත. අනතුරුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ඖෂධීය ශාක හා සගන්ධ ශාකවල කාර්මික භාවිතය පිළිබඳ පශ්චාත් උපාධිය (Industrial Utilization of medicinal and Aromatic Plants) හදාරා ඇත. එසේම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පවත්වනු ලබන භාහිර ඖෂධවේදී පාඨමාලාව හදාරා ඇත.

ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස රාජ්‍ය සේවයට එක්ව දියතලාව පළාත් ආයුර්වේද මහ රෝහලේ වසර 10 සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. දැනට මීගොඩ ආයුර්වේද මහ රෝහලේ ශල්‍ය අංශයේ වෛද්‍ය නිළධාරියකු ලෙස සේවය කරයි.


වෛද්‍ය කේ.එච්.සී.එස්.අබේදීර මහතා



කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයෙන් ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය (BAMS) හා සබරගමුව විශ්වවිද්‍යාලයේ කලමණාකරණ පීඨයෙන් ආයුර්වේද රෝහල් කළමණාකරණය පිළබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ගෙන ඇත.

2000 වසරේ සිට 2004 වසර අවසානය දක්වා පුද්ගලික ආයුර්වේද බෙහෙත්ශාලා පවත්වාගෙන ගොස් ඇති අතර 2004 වසරේදී රාජ්‍ය සේවයට එක්ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ මීගහජතුර ග්‍රාමීය ආයුර්වේද රෝහල,බෙලිඅත්ත දිස්ත්‍රික් ආයුර්වේද රෝහල යන රෝහල් වල වෛද්‍ය නිළධාරියකු ලෙසත්, ඕකේවෙල ආයුර්වේද මධ්‍යම බෙහෙත්ශාලාවේ කාර්යභාර වෛද්‍ය නිළධාරියා ලෙසත් සේවය කර ඇත. දැනට කටුවන ප්‍රාදේශීය සභාවේ කිරම නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ස්ථානභාර වෛද්‍ය නිළධාරියා ලෙස සේවය කරනු ලබයි.

ආයතන ව්‍යුහය


අධ්‍යක්ෂ මණ්ඩලය
සභාපති
කළමණාකාර අධ්‍යක්ෂ
සාමාන්‍යාධිකාරී
ස.සාමාන්‍යාධිකාරී (මානව සම්පත්)
ස.සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
ස.සාමාන්‍යාධිකාරී (අලෙවි)
ස.සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා)
අභ්‍යන්තර විගණක
කළමණාකරු (මානව)
කළමණාකරු (පුප්‍රසු)
කළමණාකරු (මූල්‍ය)
කළමණාකරු (අලෙවි)
ප්‍රාදේශීය කළමණාකරු
කළමණාකරු (සැපයුම්)
කළමණාකරු (සැපයුම)
කළමණාකරු (කන්ඩායම)
කළමණාකරු (කර්මාන්තශාලා)
ප්‍රධාන වෛද්‍ය නිලධාරී
වෛද්‍ය නිලධාරී (ITH)
විගණන නිලධාරී
පරිගණක දත්ත නිලධාරී
ආරක්ෂක නිලධාරී
පරිපාලන නිලධාරී
මූල්‍ය නිලධාරී(02)
ස.ක.ළ.අලුවර්ධන (03)
අලෙවි නිලධාරී
ව්‍යාපෘති නිලධාරී
සැපයුම් නිලධාරී(02)
කන්ඩායම නිලධාරී
හානික නිලධාරී(02)
සහායක කාර්ය මණ්ඩලය

පටුන

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	-	**1-25**
ආයතනික පාලන වාර්තාව	-	**26-27**
විගණකාධිපති වාර්තාව	-	**28-37**
මූල්‍ය ත්ත්වය පිළිබඳ වාර්තාව	-	**38**
ආදායම් ප්‍රකාශය	-	**39-40**
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	-	**41**
ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	-	**42**
ගිණුම්කරණ ප්‍රතිපත්ති	-	**43-57**
ගිණුම් පිළිබඳ සටහන්	-	**58-76**
පසුගිය වසර 10ක වැදගත් මූල්‍ය විස්තර	-	**77**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2024 වර්ෂය

01. හැදින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට නිවේදනයෙන් සංස්ථාව පිහිටුවා ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2024.12.31 දිනෙන් අවසන් වර්ශය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

02. ප්‍රධාන අරමුණු

01. ආයුර්වේද ඖෂධ වර්ග හෙයිසජ්ජ ද්‍රව්‍ය හා සකස් කල ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ විකිණීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාරය කරගෙන යාම.

02. අත්‍යවශ්‍ය ආයුර්වේද සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ දෙවර්ගයම) ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදාහැරීම .

03. දේශීය වශයෙන් නිපදවන අමු ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.

04. ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ හෙයිසජ්‍ය ද්‍රව්‍ය පර්යේෂණ කිරීම හා එබදු ඖෂධ වර්ග ප්‍රමිත කිරීම.

05. ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යාම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වල දේශීය ඖෂධ වර්ග නිපදවීම.

06. ආයුර්වේද ඖෂධ වර්ග නිශ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගැනීම වස් කිරිපට්ටි පවත්වාගෙන යාම.

07. ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

08. ආයුර්වේදය ප්‍රකාරව ප්‍රතිකාර සහ සහන සපයනු ලබන වෛද්‍ය මධ්‍යස්ථාන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා මෙන්ම එවැනි මධ්‍යස්ථාන නිසි පරිදි ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා උචිත තැනැත්තන් සහ ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම.

09. ආයුර්වේදය පිළිබඳ අධ්‍යන පාඨමාලා සහ ආයුර්වේද වෘත්තියට අදාල පුහුණු වැඩසටහන් සපයනු ලබන අධ්‍යන ආයතන නිසි කාර්ය පටිපාටි අනුගමනය කිරීමෙන් පසුව පිහිටු වීම, එවැනි පාඨමාලා සහ වැඩසටහන් තේරීම සහ සකස් කිරීම සම්බන්ධ තැනැත්තන් හෝ ආයතන සමඟ ගිවිසුම් වලට ඇතුළත් වීම සහ ඒ හා සම්බන්ධ දේශන පැවැත්වීම.එවැනි පාඨමාලා සහ වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් සඳහා ඩිප්ලෝමා සහ සහතික පත්‍ර ප්‍රධානය කිරීම.

10. වාණිජ කාර්යය සඳහා භාවිතා කරනු ලැබිය හැකි වගාවේ ඵලදාව, අස්වැන්න හෝ අවශේෂ කොටස් ඇතුළත් වන්නා වූද 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 77 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආයුර්වේද සංග්‍රයේ නියම කරනු ලැබ ඇති පරිදි ආයුර්වේදයෙහි නියැලීමේ දී භාවිතා කිරීම සඳහා වූද ඖෂධීය ශාක වගා කිරීම සහ එම කටයුතු නගා සිටුවීමෙහි ලා උචිත තැනැත්තන් සහ ආයතන සමඟ ගිවිසුම් වලට ඇතුළත් වීම.


03. ආයතනික තොරතුරු

3.1. ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

අංක 94,පරණ කොට්ටාව පාර,නාවින්න මහරගම දරණ ස්ථානයේ පිහිටා ඇත.

3.2 අලෙවි මධ්‍යස්ථාන

නාවින්න	නාවින්න හෙළ ඔසුහල , අංක **94** , පරණ කොට්ටාව පාර ,නාවින්න , මහරගම
විජේරාම	විජේරාම වෙද ගෙදර අංක **22** , ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල , නුගේගොඩ.
අනුරාධපුර	අංක **521/21**,මෛත්‍රීපාල සේනානායක මාවත, නව නගරය, අනුරාධපුර.
මොණරාගල	මොණරාගල හෙළ ඔසුහල ,අංක **267**, වැල්ලවාය පාර,මොණරාගල.
මහනුවර	මහනුවර හෙළ ඔසුහල , අංක **70** , යටිනුවර වීදිය , මහනුවර.
බොරැල්ල	බොරැල්ල හෙළ ඔසුහල ,ආයුර්වේද ජාතික ශික්ෂණ රෝහල , එන්.එම් පෙරේරා මාවත, බොරැල්ල.
බදුල්ල	බදුල්ල හෙළ ඔසුහල , බි.**35 -36**,පළමු මහල,බස් නැවතුම් පොළ, බදුල්ල.
ගාල්ල	ගාල්ල හෙළ ඔසුහල ,අංක **38** , ඔල්කට් මාවත ,ගාල්ල.
දියතලාව	දියතලාව හෙළ ඔසුහල ,සනානි මන්දිරය ,දියතලාව.
යාපනය	යාපනය හෙළ ඔසුහල , අංක **169**.කේ. කේ. එස් පාර, යාපනය.



3.3 විගණකවරු

විගණකාධිපති, අංක 306/72, පොල්දුව පාර,බත්තරමුල්ල

3.4 බැංකු

මහජන බැංකුව සහ ලංකා බැංකුව

04. අධ්‍යක්ෂ මණ්ඩලය (2024.11.03 සිට 2024.12.31 දක්වා)

01. ගිතාමනී සී කරුණාරත්න මිය	-	සභාපති
02. වෛද්‍ය එම්.ජේ.මාරසිංහ මයා	-	කළමණාකාර අධ්‍යක්ෂ
03. ඕ.වී.චන්දන තිලකරත්න මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04. චන්ද්‍රිකා සේනානායක මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
05. වෛද්‍ය එම්.ඩී.පී.ජයසුන්දර මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06. වෛද්‍ය කේ.එච්.සී.එස්.අබේදීර මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07. ඩබ්ලිව්.ඒ. එච් විමලජීව මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08. වෛද්‍ය එස්.ජේ.සී.සමරනායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩලය (2024.01.01 සිට 2024.10.28 දක්වා)

01. ආචාර්ය අනුර ඇතුලත්මුදලි මයා	-	සභාපති
02. පි.එල්.ගයා සංජීව කාංචන මයා	-	කළමණාකාර අධ්‍යක්ෂ
03. ගිතාමනී සී කරුණාරත්න මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.02.08 දක්වා)
04. චන්ද්‍රිකා සේනානායක මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
05. චන්දන තිලකරත්න මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.03.28 සිට)
06. යූ.ජී.ඉන්දික පුෂ්පකුමාර මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07. එම්.ඩි.ජේ.අබේගුණවර්ධන මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08. එම්.එම්.එස්.පුංචිබණ්ඩා මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

05. විධායක නිලධාරී මණ්ඩලය

01. සාමාන්‍යාධිකාරී	-	පී.ඩී.ධම්මික මයා
02. සහකාර සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා)	-	කේ.ඩී.එම්.ඒ.චන්ද්‍රසේකර මයා
03. ප්‍රධාන වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය කේ.ඒ.සී.ඩී.කොඩිකාර මිය (2024.04.21 දක්වා)
04. ප්‍රධාන වෛද්‍ය නිලධාරී(වැ.බ)	-	වෛද්‍ය එම්.කේ.එන්.ගුණසේකර මිය (2024.04.22 සිට)
05. සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) (වැ.බ)	-	කැළුම් පතිරවසම් මයා
06. කළමනාකරු (මුදල්)	-	කැළුම් පතිරවසම් මයා
07. කළමණාකරු (මානව සම්පත්)	-	එම්.තිලානි විජේසිංහ මිය
08. කළමනාකරු (සැලසුම්)	-	ජගත් කෝරළේගේ මයා
09. වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය ටී.කේ.ලියනගේ මිය
10. කළමනාකරු (අලෙවි)	-	එච්.එම්.ඩී.ඩී.ධනංජ මයා
11. කළමනාකරු (තත්ත්වපාලන)	-	කේ.ඒ.එච්.කේ.කස්තුරිආරච්චි මයා
12. වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය වී.එම්.එල්.එස්.නිමලරත්න මයා
13. කළමනාකරු (සැපයුම්)	-	ශංඛ මධුශාන් තරිඳු පෙරේරා මයා (2024.12.03 දක්වා)
14. කළමනාකරු (සැපයුම්)(රා.ඉ)	-	වී.එම්.එල්.එස්.නිමලරත්න මයා (2024.12.04 සිට)
15. කළමනාකරු (පිරිවැය)	-	ආර්.ජේ.රසාංගි රාජපක්ෂ මෙනවිය
16. කළමනාකරු (කර්මාන්තශාලා)	-	ඩබ්.එම්.බී.ඊ.විජේසේකර මයා
17. වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය එච්.විමංග විජේවර්ධන මයා
18. වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය ඩී. ෂෙහාන් රාසාද් ද සිල්වා මයා
19. වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය ටී.එන්.ඩබ්.එම්.එස්. නානායක්කාර මයා

අභ්‍යන්තර විගණක අංශය

01. අභ්‍යන්තර විගණක	-	ඒ.ඩී.නිල්මිණි කාංචනා ප්‍රේමරත්න මිය

06. කාර්ය මණ්ඩල සංයුතිය


2024 වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

තනතුරු නාමය	කාර්යාලය	නිෂ්පාදනාගාරය	ඩිඹේරාම අ.ඖ	නාවින්න අ.ඖ	මහනුවර අ.ඖ	දියතලාව අ.ඖ	බදුල්ල අ.ඖ	අනුරාධපුරය අ.ඖ	මාතර අ.ඖ	රත්නපුර අ.ඖ	මොණරාගල අ.ඖ	ගාල්ල අ.ඖ	බොරැල්ල අ.ඖ	යාපනය අ.ඖ	බේරුවල අ.ඖ	ජා ඇල අ.ඖ	නිකවැරටිය ඖෂධ උයන	මදවච්චිය ඖෂධ උයන	දංගොල්ල ඖෂධ උයන	ඇඹිලිපිටිය අ.ඖ	නාරහේන්පිට අ.ඖ	කිරිබත්ගොඩ අ.ඖ	එකතුව
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	1	1																					02
කළමනාකරුවන්	6	6																					12
කණිෂ්ඨ කළමනාකරුවන්	5	3																					08
කළමනාකරණ සහකාර සේවා තාක්ෂණික නිලධාරීන්	3	11																					14
කළමනාකරණ සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන්	46	23	1	1	1	1	1	1	1	1			1	1	1	1	1		1		1	1	85
ප්‍රාථමික ගණය අර්ධ ශිල්පීය නිලධාරීන්		10																					10
ප්‍රාථමික ගණය ශිල්පීය නිලධාරීන්		15																					15
ප්‍රාථමික ගණය ශිල්පීය නොවන නිලධාරීන්	27	137	1	1	1	1	1	2		1	1		1	1	1	1	1		2		1	1	182
කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්		1																					01
ස්ථීර සේවකයින්ගේ එකතුව (1)	**88**	**207**	**2**	**2**	**2**	**2**	**2**	**3**	**1**	**2**	**1**	**0**	**2**	**2**	**2**	**2**	**2**	**0**	**3**	**0**	**2**	**2**	**329**
අනියම් කම්කරු / තාවකාලික කම්කරු/ (දෛනික වැටුප්)		1	1														20		15				37
ස්ථීර හා තාවකාලික කම්කරු එකතුව (1)+(2)	**88**	**208**	**3**	**2**	**2**	**2**	**2**	**3**	**1**	**2**	**1**	**-**	**2**	**2**	**2**	**2**	**22**	**-**	**18**	**-**	**2**	**2**	**366**

07. කාර්ය සාධනය


පිරිවැටුම

පසුගිය වසර කිහිපයට සාපේක්ෂව වාර්ෂික පිරිවැටුම වැඩි වී ඇත. එය පසුගිය වසරට සාපේක්ෂව 25% වර්ධනයක් පෙන්නුම් කරයි.




නිෂ්පාදනය

නිෂ්පාදනය පෙර වර්ෂයට සාපේක්ෂව 6%ක පමණ අඩුවිමක් සිදු වී ඇත.



බදු පසු ශුද්ධ ලාභය

වර්ෂ 2021,2022 තිබුණ අලාභදායී තත්ත්වය වර්ෂ 2023 හා තත්වර්ෂයේදි ලාභදායකත්වයට පත්කර ගැනිමට හැකි වී ඇත.



08. සේවක දිරිදිමනා සහ සුභසාධනය

8.1 සේවක දිරි ගැන්වීම

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පහත සඳහන් දිමනා ලබා දෙනු ලැබේ.

- පැමිණීමේ දිරි දිමනා
- නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දිමනාව
- ඵලදායිතා දිමනාව
- වාර්ෂික ප්‍රසාද දිමනා
- ඉතිරි වෛද්‍ය නිවාඩු දිමනා

8.2 සේවක සුභසාධනය

අප සංස්ථාවේ සේවක සුභසාධනය සඳහා පහත සඳහන් වැඩ පිළිවෙළ දැනට ක්‍රියාත්මක කර ඇත.

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුව සම්බන්ධ වන සියලුම සේවකයින්,අලෙවි මධ්‍යස්ථාන සේවකයින් සහ රියදුරන් සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.
- සියලුම සේවකයින්ට උදැසන කෙටි ආහාරයක් සමඟ තේ ලබා දීම සහ රාත්‍රී සේවය කරන ලද සේවකයින් වෙත රාත්‍රී ආහාර සැපයීම.
- අවමංගල්‍ය අවස්ථාවලදී සේවකයන් වෙත ලබාදෙන පාංශුකූල දීමනාව ලෙස රු.6,500.00ක් ලබා දීම.
- සිංහල හා හින්දු අළුත් අවුරුදු සැමරුම වෙනුවෙන් අප්‍රේල් මස දී සෑම සේවකයෙකු සඳහාම රු.10,000.00ක තෑගි වවුචරයක් ලබා දීම.

8.3 ආයතනික සමාජ වගකීම

ආයතනික සමාජ වගකීම වෙනුවෙන් අදාල අනුමත සීමාවන් යටතේ සංස්ථාවේ ඖෂධ මංපුසා ලබා දීම සහ විවිධ රාජ්‍ය සහ ඒ හා සම්බන්ධ උත්සව සඳහා පැමිණෙන ජනතාව වෙත ඔසු පැන් ලබා දීම සිදු කර ඇත.

නීරෝගා Ayurveda & Herbal Expo – 2024 ප්‍රදර්ශනයට සහභාගී වීම සහ ප්‍රවර්ධන කටයුතු.





Medicare– 2024 හා නිරෝගා ආයුර්වේද ප්‍රදර්ශනය





9. ලබාගත් ජයග්‍රහණ

ගරු අග්‍රමාත්‍යය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනියගේ ප්‍රධානත්වයෙන් 2024 ඔක්තෝම්බර් 15 දින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටල් පරිශ්‍රයේදී පැවති කර්මාන්ත අමාත්‍යාංශ හා ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය එක්ව 23වන වරට සංවිධානය කරන ලද විශිෂ්ඨතම කර්මාන්තකරුවන් ඇගයීම(**CNCI ACHIEVER AWARDS 2024**) වෙනුවෙන් මහා පරිමාණ අංශයේ රජයේ නිෂ්පාදන කේෂ්ත්‍රයේ එකම කුසලතා සම්මානය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් දිනාගන්නා ලදි.



10. ඖෂධ නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.

NO	ITEM	SCALE	2024	2023	2022	2021	2020
1	ARISHTA	750ml	36,961	93,527	49,706	87,385	97,084
2	ASAWA	750ml	46,986	72,706	43,560	71,010	75,174
3	QUATHA	750ml	107,311	91,805	91,540	104,249	108,655
4	SYRUP	750ml	13,370	20,995	15,233	11,949	23,616
5	THAILA	750ml	229,480	218,000	175,376	207,305	160,621
6	CHOORNA	1kg	27,925	29,884	23,032	27,417	24,422
7	KALKA	1kg	8,292	9,608	6,620	11,639	7,247
8	LEHA	1kg	1,069	3,645	797	3,178	2,215
9	LEPA	1kg	8,867	10,173	7,419	8,359	8,021
10	MODAKA	1kg	1,907	3,272	2,494	3,832	2,153
11	RASA	1kg	1,800	2,401	1,900	2,199	1,570
12	GUGUL	1kg	6,797	7,447	5,689	7,103	7,038
13	WATIKA	1kg	4,518	7,064	4,506	5,997	4,851
14	WINE	750ml		-	-	-	-
15	New Products Main Factory	1kg	15,700	6,826	9,078	46,306	21,552
16	New Factory Products	1kg	4,285	5,907	5,957	9,451	6,670
17	New Factory Products	1L	8,385	26,846	24,347	25,251	20,432
18	Re Fill Item	750ml	5,574	8,223	8,215	16,356	5,485
19	New Products (PACK)						
	1) OUSHADHA MANJUSA SPECIAL PACK	NOS				400	
	2) SANSTHA ESSENTIAL OIL PACK	NOS		99			
	3) SANSTHA FIRST AID BOX	NOS		49			

11. රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම පහත පරිදි දැක්වේ.

(රු. මිලියන)

	2024 වර්ෂය	2023 වර්ෂය	2022 වර්ෂය	2021 වර්ෂය	2020 වර්ෂය
රාජ්‍ය අංශය	1287.51	962.41	730.34	593.61	517.46
අලෙවි මධ්‍යස්ථානය					
විජේරාම අලෙවි මධ්‍යස්ථානය	14.73	13.32	9.86	9.38	7.22
ජංගම අලෙවිය	0.77	6.29	19.71	45.76	22.85
මහනුවර අලෙවි මධ්‍යස්ථානය	12.42	9.09	9.87	9.15	9.60
දියතලාව අලෙවි මධ්‍යස්ථානය	4.22	4.82	5.39	4.98	4.03
අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය	15.09	14.21	11.29	7.22	14.96
බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	5.66	5.99	6.48	4.92	4.68
පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය	-	-	1.94	3.55	4.03
නාවින්න අලෙවි මධ්‍යස්ථානය	37.01	37.85	33.21	32.59	26.04
අංක 008 ගබඩාව	21.67	44.52	13.90	9.58	4.89
රත්නපුර අලෙවි මධ්‍යස්ථානය	8.33	9.85	6.78	5.33	4.83
යාපනය අලෙවි මධ්‍යස්ථානය	20.16	15.82	12.22	12.05	11.78
ගාල්ල අලෙවි මධ්‍යස්ථානය	10.27	14.27	9.84	8.99	6.48
සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය	-	-	-	-	1.38
මොණරාගල අලෙවි මධ්‍යස්ථානය	7.24	6.42	6.60	7.78	5.46
මාතර අලෙවි මධ්‍යස්ථානය	13.53	14.05	9.11	10.74	9.47
බොරැල්ල අලෙවි මධ්‍යස්ථානය	17.19	14.17	10.53	7.73	8.09
මාතලේ අලෙවි මධ්‍යස්ථානය	-	-	1.72	3.61	3.90
අළුත්ගම අලෙවි මධ්‍යස්ථානය	-	-	-	-	1.07
ජා ඇළ අලෙවි මධ්‍යස්ථානය	7.90	8.09	8.99	7.13	2.26
බස්නාහිර පළාත් අලෙවි මධ්‍යස්ථානය	-	-	2.51	5.44	3.92
බේරුවල අලෙවි මධ්‍යස්ථානය	18.50	10.57	7.97	7.60	1.89
නාරහෙන්පිට අලෙවි මධ්‍යස්ථානය	2.66	6.17	4.22	1.98	-
කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	6.71	9.37	3.96	-	-
ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය	8.36	8.25	9.47	1.14	-
පොල්වත්ත සුවසේවා අලෙවි මධ්‍යස්ථානය	0.53	-	-	-	-
මුළු එකතුව	**1,520.46**	**1,215.53**	**935.91**	**800.26**	**676.29**

12. ආදායම් බෙදී ගිය අයුරු (ප්‍රතිශතයක් ලෙස)

	2024	2023	2022	2021	2020
විකුණුම්	100.00	100.00	100.00	100.00	100.00
අඩු කළා :- විකුණුම් පිරිවැය	70.59	62.23	77.25	76.19	69.77
දළ ලාභය	29.41	37.77	22.75	23.81	30.23
එකතු කළා - වෙනත් ආදායම්	2.75	3.47	3.56	3.23	1.28
එකතුව	32.16	41.25	26.32	27.04	31.52
අඩු කළා	-	-	-	-	-
ආයතන හා පරිපාලන වියදම්	13.59	14.61	19.76	19.11	19.98
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	8.04	10.03	11.06	10.45	11.88
මූල්‍ය වියදම්	0.19	0.30	0.46	1.28	0.82
මුළු වියදම	21.82	24.94	31.28	30.84	32.67
මෙහෙයුම් ලාභය	10.34	16.31	(4.96)	(3.80)	(1.16)
එකතු කළා - පොළී ආදායම් සහ මෙහෙයුම් නොවන ආදායම්	1.70	1.63	2.20	1.59	2.56
බදු අඩු කිරීමට පෙර ලාභය	12.04	17.95	(2.76)	(2.22)	1.40
අඩු කළා	-	-	-	-	-
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	3.03	6.33	0.06	-	0.50
ශුද්ධ ලාභය	**9.01**	**11.62**	**(2.82)**	**(2.22)**	**0.90**

13. ලාභ දායකත්වය (රු.මිලියන වලින්)

(රු.මිලියන)

	2024	2023	2022	2021	2020
විකුණුම්	1519.78	1,215.28	935.89	800.22	676.30
අඩු කළා :- විකුණුම් පිරිවැය	1,072.81	756.21	722.96	609.65	471.83
දළ ලාභය	446.97	459.07	212.93	190.57	204.47
එකතු කළා - වෙනත් ආදායම්	41.76	42.22	33.36	25.82	8.69
මුළු ආදායම	488.73	501.29	246.29	216.39	213.16
අඩු කළා	-	-	-	-	-
ආයතන හා පරිපාලන වියදම්	206.53	177.49	184.92	152.91	135.10
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	122.15	121.89	103.53	83.63	80.34
මූල්‍ය වියදම්	2.88	3.68	4.29	10.27	5.54
මුළු වියදම	331.56	303.06	292.74	246.81	220.98
මෙහෙයුම් ලාභය/අලාභය	157.17	198.23	(46.45)	(30.42)	(7.82)
එකතු කළා - පොළී ආදායම්	25.76	19.86	20.64	12.70	17.28
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	(46.02)	(76.88)	(0.59)	-	(3.36)
ශුද්ධ ලාභය/අලාභය	**136.91**	**141.21**	**(26.40)**	**(17.72)**	**6.10**

14. තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් 2015 වර්ෂයේ දී එකඟ වී ඇති තිරසාර සංවර්ධන අරමුණු මුලික කරගත්, වර්ෂ 2030 දී සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් ඉලක්ක කර ඇති පහත සඳහන් අරමුණු සඳහා 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සෘජු දායකත්වයක් දක්වා ඇත.

i.	වන අරමුණ	-	දරිද්‍රතාවයෙන් තොර වීම.
ii.	වන අරමුණ	-	කුසගින්න තුරන් කිරීම
iii.	වනඅරමුණ	-	නීරෝගී බව හා යහපැවැත්ම.
iv.	8 වන අරමුණ	-	සුනිසි මෙහෙවර හා ආර්ථික වර්ධනය.
v.	12 වන අරමුණ	-	වගකීමෙන් යුතු පරිභෝජනය හා නිෂ්පාදනය.

15. නිෂ්පාදනය වැඩි කිරීම

- අමුද්‍රව්‍ය සපයා ගැනීම

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා දේශීය සැපයුම්කරුවන්ගෙන් ඖෂධ මිලදි ගැනීමට සංස්ථාව අතීතයේ සිට කටයුතු කර ඇත. නමුත් දේශීයව සපයා ගැනීමට නොහැකි ඖෂධ හා ප්‍රමාණාත්මක තොග දේශීයව සපයා ගැනීමට අසීරු ඖෂධ බහුලව ඇති ඉන්දියාව වැනි රටවලින් අමුද්‍රව්‍ය සෘජුව ආනයනය කිරීම තුලින් හා දේශීය ඖෂධ ආනයනකරුවන් ගෙන් සපයා ගනීම සිදු කරනු ලබයි.

16. ඔසු උයන් පාලනය

➢ නිකවැරටිය ඔසු උයන

මුළු භූමි ප්‍රමාණය අක්කර 50ක් පමණ වන අතර නික, තොටිල, කිරාත, අඩතොඩා, සැවැන්දරා, සමන්පිච්ච, සහ කොමාරිකා, හීං අරත්ත, වැනි බෝග සහ අරළු, රත්හඳුන්, සුදු හඳුන්, කොහොඹ වැනි සිපිරි ඖෂධ වගා කර ඇත.



ආඩතෝඩා



කිරාත



අළුකෙසෙල්



කහ

➢ දංගොල්ල ඔසු උයන

අක්කර 35ක පමණ භූමියක අක්කර 15කට ආසන්න ප්‍රමාණයක් කෙටි කාලීන බෝග වන මුං ඇට, උඳු, හීං අරත්ත, තල, කිරාත, නික, වැනි බෝග වගා කර ඇත. තවත් අක්කර 15කට ආසන්න භූමි ප්‍රමාණයක අරළු, බුළු, නෙල්ලි, බෙලි, පලොල්, ඇඹුල් දොඩම්, දෙහි, කුරුඳු වැනි දිර්ඝ කාලීන බෝගද වගා කර ඇත.



තල



මුං ඇට



උඳු



කිරාත

➢ මැදවච්චිය ඔසු උයන

අක්කර 5 1/2 ක පමණ භූමි ප්‍රමාණයක් සහිත මෙම ඔසු උයනෙහි අත්තන, පොල්, කුඹුක්, මී, බුළු, වැනි බෝග සිටුවා නඩත්තු කරනු ලබයි.

17. නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම

➢ ප්‍රාග්ධන ව්‍යාපෘති

- **ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක් (Sound Proof Diesel Generator) නව නිෂ්පාදනාගාරයේ ස්ථාපනය කිරීම.**



ඇසුරුම් අංශය පුළුල් කර නවීකරණය කිරීම.





18. නව නිෂ්පාදන හඳුන්වාදීම සහ අලෙවි ප්‍රවර්ධනය

- **නව නිෂ්පාදන හඳුන්වා දීම**

ඖෂධ සංග්‍රහයේ ඇති නිෂ්පාදනයක් එළි දැක්වීමට අප සංස්ථාව කටයුතු කරන ලදි.

- **රාස්නා සප්තක කෂාය පෙති**
- **කෙණ්ඩා පෙරලුම්හර තෙලය.**





- **අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිමි ඖෂධ අලෙවිය වර්ධනය කර ගැනීම සඳහා දිවයින පුරා පවතින රජය සහ රජයට අනුබද්ධිත ආයතන සහ පෞද්ගලික ආයතනවල පවත්වන ලද අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පහත පරිදි වේ.

මාසය	අලෙවි මධ්‍යස්ථානය	ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වූ දිනය	පැවැත්වූ ආයතන පරිශ්‍රය	ශුද්ධ ආදායම
ජනවාරි	නාරාහේන්පිට අ.ම	2024.01.29	සෙත්සිරිපාය	30,721.50
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	නාවින්න රෝහල	185,720.25
පෙබරවාරි	නාරාහේන්පිට අ.ම	2024.02.26/27	නැව් සංස්ථාව	97,021.80
	දියතලාව අ.ම	2024.02.26	හපුතලේ ප්‍රා.ලේ කාර්යාලය	7,160.00
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	69,673.00
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	නාවින්න රෝහල	147,459.00
මාර්තු	නාරාහේන්පිට අ.ම	2024.03.01/02/03	BMICH	353,552.40
	බොරැල්ල අ.ම	2024.03.01/02	නෙළුම් පොකුණ	9,935.00
	විජේරාම අ.ම	2024.03.12	ගංගොඩවිල මහජන බැංකුව	15,327.90
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	132,544.00
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	නාවින්න රෝහල	61,793.50
අප්‍රේල්	නාරාහේන්පිට අ.ම	2024.04.08/09	නැව් සංස්ථාව	81,577.80
	නාරාහේන්පිට අ.ම	2024.04.09/10	ඖෂධ නීතිගත සංස්ථාව	72,461.70
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	94,966.75
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	නාවින්න රෝහල	73,169.00
මැයි	නාරාහේන්පිට අ.ම	2024.05.30	රේගු මූලස්ථානය	9,461.70
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	104,371.75
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	නාවින්න රෝහල	57,270.75

ජූනි	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	46,136.75
	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	නාවින්න රෝහල	53,964.75
ජූලි	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	35,796.00
අගෝස්තු	008 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	146,955.50
සැප්තැම්බර්	007 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	123,424.00
ඔක්තෝම්බර්	007 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	121,600.00
නොවැම්බර්	007 ගබඩාව	2024.11.25	මීගොඩ ආයුර්වේද රෝහල	13,000.00
	007 ගබඩාව	2024.11.26/27	නැව් සංස්ථාව	28,260.50
	007 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	108,442.50
දෙසැම්බර්	007 ගබඩාව	2024.12.03	ලොතරයි මණ්ඩලය	12,400.00
	007 ගබඩාව	2024.12.05	සෞඛ්‍ය අමාත්‍යාංශය	6,171.50
	8 ගබඩාව	2024.12.18	SPMC	29,416.50
	007 ගබඩාව	දෛනිකව මාසය පුරා	පොල්වත්ත සුවදිවි සායනය	99,370.00
			මුළු අලෙවි ආදායම (රු)	**2,429,125.80**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විගණන කමිටු වාර්තාව - 2024

2010/12/14 දිනැති අංක පී.ඊ.ඩී 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ආයතනයේ විගණන කමිටුව පිහිටුවා ඇති අතර විගණන කමිටු ප්‍රඥප්තිය අනුව ක්‍රියාත්මක වේ.
එම චක්‍රලේඛය අනුව විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කරගැනීම, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා ,කළමනාකරණ ලිපි,පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම , රජය විසින් නිකුත් කරන ලද නීති,රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට ඇති අනුකූලතාවය සමාලෝචනය කිරීම, ඇගයීම හා අනුකූල නොවීම් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය විය යුතුවේ.

ආයතනයේ විගණන කමිටුව භාණ්ඩාගාර නියෝජිත ඇතුලුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන්දෙනෙකුගෙන් සමන්විත වූ අතර විගණන කමිටුවේ සභාපතිත්වය දරණු ලබන්නේ භාණ්ඩාගාර නියෝජිත වන අධ්‍යක්ෂවරයාය. 2024 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් සඳහා ජාතික විගණන කාර්යාලයෙන් විගණන අධිකාරීවරයෙකු නිරීක්ෂක ලෙස සහභාගී විය. දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී එස්. අයි. සී. තුෂාරිකා මිය දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී වූ අතර 2023.08.16 දින සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී විය. විගණන කමිටුවේ ලේකම් ලෙස ආයුර්වේද සංස්ථාවේ අභ්‍යන්තර විගණක කටයුතු කරන අතර විගණන කමිටුවට වාර්තා ඉදිරිපත් කිරීම හරහා විගණන කමිටුවට සහය වනු ලබයි. විගණන කමිටුවේ ආරාධනය මත ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය විගණන කමිටු රැස්වීම් වලට සහභාගී විය.

2024 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් හතරක් (4ක් (2024.02.26, 2024.06.19, 2024.11.29 හා 2024.12.30 දිනයන්හිදී) පවත්වා ඇති අතර කමිටු සභාපති, නිරීක්ෂකයන් හා සාමාජිකයන් නියමිත සනපූර්ණය සහිතව විගණන කමිටු සඳහා සහභාගී වී ඇත.

2024 වර්ෂය තුළ කමිටුව විසින්,

- බාහිර හා අභ්‍යන්තර විගණන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩු පාඩු සම්බන්ධයෙන් අදාළ අංශ ප්‍රධානීන්ගේ පිළිතුරු අවධානයට යොමු කර ඒවා නිවැරදී කිරීම සඳහා අදාළ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සැළකිල්ලට ලක්කර ඇත.
- ආයතනයේ කාර්යයන් කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් පවත්වාගෙන යාම සඳහා ආයතනයේ විවිධ ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලනක්‍රමවල ප්‍රමාණාත්මකභාවය පිළිබඳ විමර්ශණය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- කමිටුව විසින් ලබාදී ඇති නිර්දේශ සම්බන්ධයෙන් , අදාල අංශ ප්‍රධානීන් විසින් සිදු කර ඇති පසු විපරම් කටයුතු පිළිබඳ අවධානය යොමුකිරීමත්, එම නිර්දේශ ක්‍රියාත්මක නොකරන නිළධාරීන් සම්බන්ධයෙන් දිරි දීමනා අත්හිටුවීමටත් නිර්දේශ කර නිළධාරීන්ගෙන් අපේක්ෂිත කාර්යසාධනය ලගාකරගැනීමට කටයුතු කර ඇත.
- 2023 හා 2024 වර්ෂයන් තුළ ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කරන ලද විගණන විමසුම් හා විගණකාධිපති වාර්තාවන් පිළිබඳ අවධානය යොමු කර පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් හා ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත.
- ආයතනයේ ඉතා වැදගත් වත්කමක් වන තොගය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය මගින් අනාවරනය කරනු ලැබූ වැරදි හා වංචා සම්බන්ධයෙන්, කළමනාකාරීත්වය විසින් ගෙන ඇති නිවැරදිකරණ ක්‍රියාමාර්ග හා පසු විපරම් කටයුතු පිළිබඳ අවධානය යොමු කර ඇත.

- ආයතනයේ සියලු අංශ සම්බන්ධ වන පරිදි , වැරදි වංචා අවම කිරීමටත්, නිවැරදි තීරණ ගැනීම සඳහා තොරතුරු වලට පිවිසීමටත් හැකිවන පරිදි, පරිසනක පද්ධතියක් හදුන්වාදීමටත් නිර්දේශ ලබාදී ඇත.
- ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රම හදුන්වාදීමට හා ශක්තිමත් කිරීමට අවශ්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදී ඇත.
- 2024 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම ,ක්‍රියාකාරී සැලැස්ම,ප්‍රසම්පාදන සැලැස්ම හා විගණන සැලැස්ම එකිනෙකට අනුගතවන ලෙස සකස් කර නියමිත දිනදී ඉදිරිපත් කිරීමට හා ක්‍රියාත්මක කිරීමටත්, එමගින් ආයතනයෙහි කාර්යසාධනය ඉහළ නැංවීමටත් ඉහළ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කර ඇත.
- 2024 වර්ෂයන් තුළ ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කරන ලද විගණන විමසුම් අනුව පෙන්වාදී ඇති නීත්‍යානුකූල නොවන බදවාගැනීම් හා ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදී ඇත.

විගණන කමිටු සංයුතිය

01. ඩබ්. ඒ. එච් විමලජීව මිය	- භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති)
02. ඕ. වී. සී. තිළකරත්න මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික)
03. එස්. ඒ. ජේ. සී. සමරනායක මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික)
04. එස්. අයි. සී. තුෂාරිකා මිය	- ප්‍රධාන ගණකාධිකාරී (දේ. වෛ. රාජ්‍ය අමා.) (කමිටු නිරීක්ෂක)
05. ආර්. එම්. එස් වසන්තා මිය	- ප්‍රධාන අභ්‍යන්තර විගණක (සෞඛ්‍ය අමා.) (කමිටු නිරීක්ෂක)
06. කේ. කන්දගේ මහතා	- රජයේ විගණන අධිකාරි - (කමිටු නිරීක්ෂක)


- 2024/11/28 දින දක්වා චන්ද්‍රිකා සේනානායක මිය භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති) ලෙසද, 2024/06/19 දින දක්වා යූ. ජී. අයි. පුෂ්පකුමාර මයා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික) ලෙසද සහභාගී විය.

ඩබ්. ඒ. එච් විමලජීව

කමිටු සභාපති

ස්තුතිය

- සංස්ථාව වෙත පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීම සඳහා මගපෙන්වීම ලබාදුන් හා සහය ලබාදුන් විෂයභාර අමාත්‍යවරුන්,නියෝජ්‍ය අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍ය වෙත.
- උපදෙස්, අනුමැතිය ලබාදීම හා මගපෙන්වීම සිදුකල සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්වරුන් ඇතුළු කාර්ය මණ්ඩලයටත්
- මගපෙන්වීම ලබාදෙමින් හා අනුමැතිය ලබාදෙමින් සහය ලබාදුන් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අනෙකුත් දෙපාර්තමේන්තු නිළධාරීන්
- නිෂ්පාදන නියාමන කටයුතුවලදී සේවය ලබාදුන් ආයුර්වේද කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ඖෂධ අලෙවි කටයුතුවලදී සහය ලබාදුන් ආයුර්වේද කොමසාරිස්, පළාත් ආයුර්වේද කොමසාරිස් හා නිළධාරීන්, පළාත් පාලන ආයතනවල නිළධාරීන්
- නිෂ්පාදන හා අලෙවි කටයුතුවලදී සහාය දැක්වූ සැපයුම්කරුවන්, අලෙවි නියෝජිතයන්ටත්
- පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මගපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්
- සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ප්‍රසංශනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමණාකාරීත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමු.



ගීතාමනි සී කරුණාරත්න

සභාපති

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මඟින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (රජය සහ ප්‍රජාව, ආයෝජකයින්, සේවකයින්,සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩි විසින් දරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, නිෂ්පාදනය, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා ආශ්‍රිත සේවා, අලෙවිකරණය, රාජ්‍ය මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි ව්‍යාප්තිමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ කළමණාකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකු ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

කළමනාකරණ කමිටුව

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරිවරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කරන ආකාර, උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මඟින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

විගණන කමිටුව

“යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ” සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපති වේ. සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලබන අතර අවශ්‍ය අවස්ථා වලදී කළමනාකාරීත්වයට අවශ්‍ය මගපෙන්වීම් සිදු කිරීම. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන අතර අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන කටයුතු විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ

ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම ආයතනවලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරි බලය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුව පවතින බැවින් ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

ලාභ අරමුණු කර ගත් රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වග කියනු ලැබේ

වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වැටුප් ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් සහ චක්‍රලේඛ මත පිහිටුවා සකසා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල දීමනා, මුදල් අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සංස්ථා වලට අදාළව නිකුත්කර ඇති චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

මාසික නිෂ්පාදනය හා සේවක පැමිණීම පාදක කර ගනිමින් නිෂ්පාදන සහ පැමිණීමේ දිරිදීමනා සියලුම සේවකයන් වෙත මාසිකව ගෙවනු ලබයි.

අභ්‍යන්තර පාලනය

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම හා වාර්තා කිරීම, නිර්දේශ කිරීම, සහතික කිරීම සහ අනුමත කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ත්ව පාලන, නඩත්තු, මූල්‍ය, සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙති.

කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරි, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. සංස්ථාව ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරි වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සෘජුවම වාර්තා කරයි.

අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තහවුරු කර ඇති අතර අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මඟින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. රජයේ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික විගණන වාර්තාව මත පදනම්ව ඒ ඒ අංශවල පවත්නා දුර්වලතා මඟහරවා ගැනීමට, සභාපති ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය සහ විගණන කමිටුවේ අවශ්‍ය මගපෙන්වීම් සිදු කරනු ලබයි.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන සහ ඒ හා සම්බන්ධ චක්‍රලේඛන මත පදනම්ව සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය තහවුරු කිරීමට ඒ ඒ මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ඇත.

අපේක්ෂිත අදායම්, පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර රේඛීය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MED/A/ADC/01/24/ 01

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 අගෝස්තු 22 දින

සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම ප්‍රකාශය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම්

(අ) නව ආයුර්වේද නිෂ්පාදන 10ක් විවෘත වෙළඳපලට හඳුන්වාදීමේ හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් 2015 මැයි 26 දින සංස්ථාවට ලබා දී තිබුණු රු.15,000,000 ක ප්‍රදානය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1හි 88 ඡේදය ප්‍රකාරව ආදායමක් ලෙස ගිණුම්ගත නොකර ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණු අතර ප්‍රතිපත්තිමය එකඟතාවයක් මත 2015 සිට සමාලෝචිත වර්ෂය දක්වා අලෙවිකරන අදාළ නිෂ්පාදන 10 හි එක් එක් ඒකකයක ලාභයෙන් සියයට 10 බැගින් අරමුදලට ගෙවූ රු.3,266,586 ක මුදල එක් එක් වර්ෂයේ වියදමක් ලෙස නොදක්වා ජංගම වගකීම් ගිණුමට හර කර තිබුණි. සමාලෝචිත වර්ෂයේද එම වරද නිවැරැදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 2 හි සඳහන් නියමයන්ට අනුකූලව පහත සඳහන් කරුණු ඉටුකර නොතිබුණි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(i) ගබඩා 05ක සහ දිවයින පුරා පිහිටි ඖෂධ අලෙවිසැල් 16 ක පැවැති නිමි නොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම් තීරු යාවත්කාලීන කර නොතිබුණි. ප්‍රමිතියේ 27 හා 28 ඡේද ප්‍රකාරව ඉතිරි නොගවල පිරිවැය අගය ශුද්ධ උපලබ්ධි අගය සමඟ සසඳා ඉන් අඩු අගය වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීම වෙනුවට නිෂ්පාදිත වර්ෂයේ නිෂ්පාදන පිරිවැය මත 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ නොගයේ අගය රු.262,641,057ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර තිබුණි.

(ii) 2024 වාර්ෂික නොග සමීක්ෂණයේදී එක් අලෙවි මධ්‍යස්ථානයක හා නිමි නොග ගබඩා 02 හි නොග සමීක්ෂණ වාර්තාවේ පොත් ඒකක ප්‍රමාණය සටහන් කර නොතිබුණු අතර සමීක්ෂණ මණ්ඩලය විසින් පිරිවැය රු.225,241,813ක්වූ නොග අයිතම 460 කට අදාළව ඒකක 658,593ක ඌනතා හෝ අතිරික්තතා හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) අලෙවිසැල් 15ක හා ගබඩා 02ක අවසන් නිමි ඖෂධ නොග වටිනාකම් ගණනය කිරීමේදී නොග අයිතම 45කට අදාළව පිරිවැය රු.3,502,295ක්වූ නොග ඒකක 18,189ක් ගණනය කර නොතිබූ අතර අලෙවිසැල් 03ක හා එක් ගබඩාවක අවසන් නිමි ඖෂධ නොග වටිනාකම් ගණනය කිරීමේදී නොග අයිතම 05කට අදාළව පිරිවැය රු.76,499ක්වූ නොග ඒකක 523ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් නිමි ඖෂධ නොග වටිනාකම් රු.3,425,795ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(iv) නොග හා සමීක්ෂණ වාර්තා අනුව භෞතිකව පැවති නොග ඒකක සැසඳීමේදී අලෙවි සැල් 09කට හා ගබඩා 02කට අදාළව රු.4,767,427ක් වටිනා නිමි නොග ඒකක 12,722ක ඌනතාවයක් හා අලෙවිසැල් 10කට හා ගබඩා 02 කට අදාළව රු.3,550,449ක් වටිනා නිමි නොග ඒකක 18,571ක අතිරික්තයක් තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවල හා ඖෂධ අලෙවිසැල්වල පැවැති හානිවූ හා කල් ඉකුත්වූ නොග වෙනුවෙන් රු.14,908,104 ක් වෙන්කර තිබුණු නමුත් හානිවූ හා කල් ඉකුත් නොගයේ නථ්‍ය වටිනාකම් රු. 18,322,395ක් වූයෙන් ඌනතා වෙන් කිරීම රු.3,414,291 ක් වී තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේ අමුද්‍රව්‍ය ගබඩා 02කට හා ලිපිද්‍රව්‍ය ගබඩාවකට අදාළව නොග හා නොග සමීක්ෂණ වාර්තා අනුව භෞතිකව පැවති ඒකක ගණන සැසඳීමේදී අයිතම 137 කට අදාළව ඒකක 1,349ක ඌනතාවයක් පැවති අතර එහි වටිනාකම් රු.1,605,816ක් විය. තවද අමුද්‍රව්‍ය ගබඩා 03ක, බෝතල් ගබඩාව හා ලිපිද්‍රව්‍ය ගබඩාවට අදාළව ඒකක 9,700ක අතිරික්තයක් වූ අතර එහි වටිනාකම් රු.3,582,635ක් වී තිබුණි.

(vii) බෝතල්, ඇසුරුම් හා ලිපිද්‍රව්‍ය ගබඩාවේ භාවිතයට ගත නොහැකි අයිතම 28කට අදාළ ඒකක 593,032ක් වූ අතර එහි වටිනාකම්වූ රු.2,113,520 ක් ඇතුළත්ව නොග ගණනය කර තිබුණි.

(viii) ගබඩා අංක 01 හා 02 හි අයිතම 98කට අදාළව රු.1,284,812 ක් වටිනා අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,236 ක ඌනතාවයක් වූ අතර අයිතම 126 කට අදාළව රු.2,696,108 ක් වටිනා අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 9,230 ක අතිරික්තයක් පැවතුණි. එසේම අවශ්‍යතාවයකින් තොරව මිලදී ගැනීම් හා ගබඩාගත කිරීම් හේතුවෙන් වෙනිවැල්ගැට කිලෝග්‍රෑම් 1,958 ක් භාවිතයට ගැනීමට නොහැකිව දිරාපත් වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි සඳහන් නියමයන්ට අනුකූලව පහත සඳහන් කරුණු ඉටුකර නොතිබුණි.

(i) ප්‍රමිතියේ 36 ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවේදී අදාළ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, 2022 වර්ෂයේ පිරිවැය රු. 41,010,767 ක්වූ වාහන 27කින් පිරිවැය රු. 37,573,800 ක්වූ වාහන 18 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. ඒ අනුව ප්‍රත්‍යාගණනය නොකරන ලද මෝටර් රථ 09ට අදාළ ක්ෂය වෙන්කිරීම් රු.2,528,501ක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට මාරු කිරීම් හේතුවෙන් ක්ෂය වෙන් කිරීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන්

දිගටම ඉදිරියට ගෙන එන එම ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව වෙනත් ජංගම වගකීම් යටතේවූ ආරක්ෂණ නැන්පතු ශේෂය හා ආරක්ෂණ නැන්පතු ලේඛනය අනුව ශේෂය පිළිවෙලින් රු.25,867,571ක් හා රු.13,167,073ක් වූයෙන් රු.12,700,498ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) ණයගැනි ශේෂ සනාථන පරීක්ෂාවේදී වටිනාකම රු.105,330,780ක්වූ ණයගැනියන් 34දෙනෙකු විසින් සංස්ථාව වෙත ගෙවීමට කිසිදු මුදලක් නොමැති බව දක්වා තිබුණි. තවද, ණයගැනියන් 02 කට අදාළව පොත් ශේෂය රු.1,637,109 ක් වූවද, එම ණය ගැනියන් විසින් තහවුරු කළ ශේෂය රු.2,223,792ක් විය. ඒ අනුව රු.104,744,097ක ඉද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(එ) මහජන බැංකුවේ ආරක්ෂිතව තැන්පත් කර තිබුණු ග්‍රෑම් 772 ක රන් තහඩු 09ක තොග වටිනාකම රු.1,841,645ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද වටිනාකම් හා පැවත්ම තහවුරු කර ගැනීමට අදාළ ලියකියවිලි ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ණයවර ලිපි වලට අදාළ සියයට 10 ක රැඳවුම් මුදල් රු. 1,894,902 කට අදාළ උපලේඛන, ආරක්ෂිත තැන්පතු රු.25,867,571 කට හා ගෙවිය යුතු තැන්පතු රු. 1,041,015 කට අදාළ උපලේඛන, තැන්පතු ලේඛන හා කාල විශ්ලේෂණ, වර්ෂ 15 ක සිට නොවෙනස්ව පවතින රු.1,923,741 ක්වූ ප්‍රාග්ධන සංචිත ශේෂය තහවුරු කර ගැනීමට අදාළ ලියකියවිලි හා රු.636,000,000 ක ඉඩම්වලට අදාළව අයිතිය තහවුරු කරන ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාළ වටිනාකම රු.11,082,007 ක්වූ ගෙවීම් වවුචර 07ක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මේ ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමහ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම් අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගත්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

ඇල්මේ ස්වභාවය		නිරීක්ෂණ
(ඇ)	නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීම	සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂක විසින් කළමනාකාර තනතුර 02ක් සඳහා ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් දෙදෙනෙකුට, ඔහුට අයත් සමාගම් දෙකක සේවය කළ බවට ව්‍යාජ සේවා සහතික ලබා දී තිබුණු අතර අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයකු වශයෙන්ද කටයුතු කර අදාළ තීරණ ගැනීම සඳහාවූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද සහභාගී වී අවශ්‍ය සේවා පළපුරුද්ද නොමැති මෙම අයදුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කර තිබුණි.
(ආ)	ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැනීම	(i) සංස්ථාවේ සැපයුම්කරුවෙකුවූ සමාගමක් සහ සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂකවරයා අතර සම්බන්ධිත පාර්ශව ගැටුමක් (Conflict of Interest) පවතින බව නහවුරු විය. නාමික සමාගමක් වූ මෙම සමාගමේ නම භාවිතා කර සංස්ථාව වෙත ප්ලාස්ටික් බෝතල් ලබාදීමට දුස්සන්ධානයෙන් යුක්තව කටයුතු කර තිබුණි. සංස්ථාව මෙම නාමික සමාගමෙන් 2023 හා 2024 වර්ෂයන්හි පිළිවෙලින් රු.10,891,681ක හා රු.23,227,843 ක ද්‍රව්‍ය මිලදිගෙන තිබුණි. සංස්ථාවට ප්ලාස්ටික් බෝතල් සැපයුම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවූ මෙම සමාගම සැපයුම්කරු ලෙස තෝරාගත් අවස්ථාවලදී අදාළ ප්‍රසම්පාදන කමිටුවලට කළමනාකර අධ්‍යක්ෂකද සාමාජිකයෙකු වශයෙන් සහභාගී වී තිබුණි.
		(ii) ප්‍රමිතියෙන් තොර ප්ලාස්ටික් බෝතල් මිලදී ගැනීම හේතුවෙන් මුසිය අසලින් ෂැම්පු කාන්දුවීම හා දියර ලබා ගැනීමට සකස් කර ඇති ආධාරකය ඉහලට එසවී තිබීම වැනි ගුණාත්මකභාවය පිළිබඳ දෝෂ හේතුවෙන් පිරිවැය රු.951,805 ක්වූ පිළිවෙලින් මිලි ලිටර් 105 ක්, 1,907ක් හා 95 ක කෝමාරිකා ෂැම්පු බෝතල් 395ක්ද මිලි ලිටර් 210 ක්වූ වෙනිවැල් බොඩිවොෂ් බෝතල් 95ක් හා මිලි ලිටර් 210 ක්වූ පංචවල්කල බොඩිවොෂ් භාවිතයට ගත නොහැකිවී තිබුණි. ප්‍රමිතියෙන් තොර මෙම ප්ලාස්ටික් බෝතල් වලින් ඒකක 8,000ක සංඛ්‍යාවක් ගබඩාව තුළ පැවතියද, සැපයුම්කරු වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති හා විධිවිධානයට යොමුව	අනුකූල නොවීම
(අ) **2018 අංක 19 දරන ජාතික විගණන පනත**	
(i) 16(2) උප වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 ඡේදය අනුව හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 6 පරිච්ඡේදයේ 6.6 ඡේදය	මුදල් වර්ෂයක් අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට, නියමිත දිනට වඩා දින 105 ක් ගත කර නිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2025 අගෝස්තු 21 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.
(ii) 38(1) උපවගන්තියේ (ඇ) ඡේදය, 38(2) උප වගන්තිය හා 2022 ජූලි 29 දිනැති අංක DMA-02/2022 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, ඉටුකළ යුතු සමාලෝචනය ලිඛිතව සිදුකළ යුතු අතර එහි පිටපත් විගණකාධිපති වෙත ලබා දිය යුතු වුවත් ඒඅනුව කටයුතු කර නොතිබුණි. මූල්‍ය පාලනය සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කර නොතිබීම මත 2024 හා 2025 වර්ෂයෙහි පිළිවෙලින් රු.16,915,307ක් හා රු.14,209,392ක මූල්‍ය වංචාවක් සිදුවී නිබුණි.
(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**	
(i) මුදල් රෙගුලාසි 110	භානි හා පාඩු ලේඛනය පිළියෙල කර නිබුණුද එය නියමිත ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය යාවත්කාලීනද කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 166	මුදල් සමඟ ලැබෙන අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම සහ විධිමත් සටහන් තබා නොගැනීම හේතුවෙන් හඳුනාගැනීමට නොහැකි වූ වර්ෂ 01ත් 05ත් අතර බැංකු ගිණුම් 04ක රු.21,109,827ක් වටිනා මුදල් තැන්පතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 371 (2), (5) හා(6) සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 09 ඡේදය	තන්කාර්ය අතුරු අග්‍රිමය ලබාගත් මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්ය නිමකළ විගසම හෝ කාර්ය නිමකර දින 10ක් තුළ අග්‍රිමය පියවිය යුතු නමුත් නිලධාරීන් 26 දෙනෙකු ලබාගෙන නිබුණු එකතුව රු.1,014950ක්වූ තන්කාර්ය අග්‍රිම 40ක් ආපසු පියවීම සඳහා කාර්යය නිමකර දින 10 සිට දින 96ක් අතර කාලපරාසයක් ප්‍රමාද වී නිබුණි.

	(iv) මුදල් රෙගුලාසි 395(ඇ)	එක් එක් මාසයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළයුතු වුවත්, ජංගම ගිණුම් 05ක් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	1969 මැයි 11 දිනැති අංක 14853/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය.	සංස්ථාවේ අරමුණු 07 අනුවින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීමට මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි
(ඈ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
	(i) මාර්ගෝපදේශ 6.3.2, 7.12.1 හා 8.9.1(ආ)	2024 වර්ෂය සඳහා රු.12,430,560ක් වටිනා ටර්පන්ටයින් කිලෝග්‍රෑම් 8,930ක් මිලදී ගැනීමේදී මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, ගිවිසුම්ගත නොවීම මත කිලෝග්‍රෑම් 150ක් දින 18ක කාල ප්‍රමාදයකින් පසුව සපයා තිබුණු හා කිලෝග්‍රෑම් 150ක් නොසපයා සති 14ක කාලයක් ගතවී තිබුණද ප්‍රමාද ගාස්තු අය කිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම කිලෝග්‍රෑම් 6,811ක් වූයෙන් අවශ්‍යතාවය නිසිපරිදි හඳුනා ගැනීමෙන් තොරව වාර්ෂික සැලසුම් සකස් කර තිබුණි.
	(ii) මාර්ගෝපදේශ 2.8.4 (ඇ), 5.4.10(ඇ) , 6.2.2, 6.3.6, 7.8.4, 8.9.1(ආ)	2024 වර්ෂය සඳහා රු.33,715,000ක් වටිනා එළගි තෙල් කිලෝග්‍රෑම් 12,260ක් ජාතික තරඟකාරී ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා සුවන්පත් දැන්වීම් පළ කර තිබුණද, කිසිදු ලංසුකරුවෙකු ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණු බව දක්වමින්, එළගි තෙල් කිලෝග්‍රෑම් 6,991ක් මිලදී ගැනීම සඳහා දින 07ක් තුළ ලියාපදිංචි හා විවෘත වෙළඳපල තුළින් විදුයුත් තැපෑල මඟින් මිල කැඳවීමට අනුමැතිය ලබාදී තිබුණි. විදුයුත් තැපෑල මඟින් එළගි තෙල් සපයන ප්‍රධාන ආයතන විශාල සංඛ්‍යාවක් පැවතියද, එම ආයතන වෙතින් මිල කැඳවීම් සිදු නොකර, තෝරාගත්තා ලද සැපයුම්කරු හා වෙනත් ආයතන වෙතින් මිල කැඳවීම් සිදු කර තිබුණි.
(ඉ)	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු වක්‍රලේඛ	පැමිණීමේ දීමනා ලෙස රු. 10,358,800 ක් වක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව ගෙවා තිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 21 දිනැති අංක PED 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01(III) ඡේදය

සේවකයින් සඳහා ඉතිරි කරගත් නිවාඩු මත දීමනා ගෙවීමේදී ගෙවීම සඳහා සලකා බලන වර්ෂයට පෙර වර්ෂයට අදාළව මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු ලාභාංශ හා අයබදු ගෙවා නිබිය යුතුවේ. මේ අනුව 2023 වර්ෂය සඳහා ගෙවිය යුතු මුළු ලාභාංශ හා අයබදු මුදල රු.42,360,391ක් වුවත් ඉන් රු.17,453,464ක් පමණක් ගෙවා නිබියදී සංස්ථාව විසින් 2024 වර්ෂය සඳහා නිවාඩු මත දීමනා ලෙස රු.6,145,026ක් ගෙවා නිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.45,725,759 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 37,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර නිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.12,144,400 ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30 ක් නිමකර නිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර නිබුණි. 2025 ජුනි 30 වන විට වසර 06 ක් ඉක්මවා නිබුණු මෙම ව්‍යාපෘතියේ අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොනිබුණි.

(ආ) පනිරගොඩ නිෂ්පාදනාගාරයට රු.9,095,322 ක් වටිනා 150 KVA විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන ස්ථාපිත කර නිබුණද, විදුලි ජනන යන්ත්‍රය ප්‍රධාන පරිපථයට සම්බන්ධ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සංස්ථාව විසින් නොගැනීම හේතුවෙන් වර්ෂයකට අධික කාලයක් නිෂ්පාදනාගාරය තුළ නිෂ්කාර්යව පැවතුණි. යන්ත්‍රය සඳහා වසරක වගකීම් සහතිකයක් නිබුණද වගකීම් කාල සීමාව ඵලදායිව උපයෝජනය කිරීමට අපොහොසත් වී නිබුණු අතර ඉදිරි වසර 06කට අදාළව දක්වා ඇති නඩත්තු පිරිවැය රේටියන් යටතේ නඩත්තු කටයුතු සිදු කර ගැනීමට විධිමත් ගිවිසුමකට එළඹ නොනිබුණි.

(ඇ) සංස්ථාවේ සෑම අංශයක්ම ආවරණය වන ආකාරයට ඒකාබද්ධ පරිගණක මෘදුකාංග පද්ධතියක් (ERP System) ස්ථාපිත කිරීම සඳහා රු.30,000,000ක මුළු මුදලක් වර්ෂ 05ක කාලයක් සඳහා මාසික රු.500,000 බැගින් ගෙවීමේ ක්‍රමවේදයක් තුලින් පුද්ගලික සමාගමක් වෙත ලංසුව පිරිනමා නිබුණි. මෙහිදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10(ඇ) ප්‍රකාරව කටයුතු කර නොනිබුණි. තවද, ලංසු ලේඛන ප්‍රකාරව මෙම පද්ධතිය සති 28ක කාලයක් තුළ ස්ථාපිත කළයුතු වුවත් මාස 02ක කාල ප්‍රමාදයක් දක්නට වූ අතර විධිමත් ලිඛිත ගිවිසුමකට නොඑළඹීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී නිබුණි. පරිගණක මෘදුකාංග පද්ධති ස්ථාපිත කර සේවක පුහුණු කිරීම් ලබා දී නිබියදී සංස්ථාව විසින් ආරම්භක අවශ්‍යතාවයන් එම පද්ධතියට ඇතුළත් කිරීමට හා කටයුතු කර නොනිබීමෙන් විගණිත දිනයවූ 2025 අගෝස්තු දක්වා එනම් මාස 09කට ආසන්න කාලයක් එම පද්ධතිය හා මෙම ERP පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමට මිලදී ගන්නා ලද රු.6,307,151ක් වටිනා පරිගණක හා අනෙකුත් උපාංග ඒකක 79ක් නිෂ්කාර්යව පැවතුණි.

3. වෙනත් කරුණු

(අ) සංස්ථාව විසින් අඛණ්ඩව විධිමත් අනුමැතියකින් තොරව රු. මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංගවල සේවකයන්ට මාසිකව රු.මිලියන 02 ත් රු.මිලියන 06 ත් අතර මුදලක් නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා නිබුණි. ඉකුත් වර්ෂයේ

රු.82,453,412 ක් වූ මෙම දිරිදීමනා වියදම සමාලෝචිත වර්ෂයේදී රු.65,985,733 ක් විය. එසේ වුවද, අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන නිෂ්පාදනය කරනු ලබන බොහෝ නිෂ්පාදනයන් ගබඩාව තුළදීම හෝ අලෙවි සැල්තුළ කල් ඉකුත් වීමට ලක්වන අතර 2022 හා 2023 වර්ෂයන්හි එසේ කල් ඉකුත්වූ හා හානිවූ නොග වටිනාකම පිළිවෙලින් රු.12,885,943ක් හා රු.6,996,583ක් විය. ගුණාත්මකභාවය පිළිබඳ දෝෂ හේතුවෙන් ගබඩා වෙත 2023 හා 2024 වර්ෂයන්හි ආපසු භාරදෙන නිෂ්පාදනයන්හි වටිනාකම රු.2,573,644ක් විය. මේ අනුව, නිෂ්පාදන දිරි දීමනා ගෙවීමේදී සංස්ථාවට ආදායම් උපයාගත නොහැකිවූ ගුණාත්මකභාවය පිළිබඳ දෝෂයන් හා කල් ඉකුත්වූ නිෂ්පාදනයන් සඳහාද දිරි දීමනා ගෙවීමට කටයුතු කර තිබුණි.

(ආ) 2017, 2018, 2020 හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. 102,000,000 කින් රු. 26,149,834 ක් හෙවත් සියයට 26 ක් 2025 ජූනි 30 දින වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

(ඇ) වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව නිෂ්පාදනයන් 13කට අදාළව නිෂ්පාදන ඒකක 1,505,478ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය ඒකක ප්‍රමාණය 527,249ක් වූයෙන් ඒකක 978,229ක ප්‍රමාණයක් එනම් සියයට 65ක් නිමකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ඈ) සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ සමස්ථ විකුණුම් අදායම් ඇස්තමේන්තුව රු.1,862,515,000 ක්වූ අතර තත්‍ය ආදායම රු.1,519,775,447ක් විය. තත්‍ය ආදායමෙන් සියයට 81 ක් රාජ්‍ය අංශයෙන් හා සියයට 19ක් පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පෞද්ගලික අංශයේ අලෙවි ආදායම සියයට 26 සිට සියයට 19 දක්වා අඩුවී තිබුණි. වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, වෙළඳ පොළ මිලට සාපේක්ෂව විකුණුම් මිල වැඩිවීම, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීම, විකුණුම් අදායම අඩුවීමට හේතුවී තිබුණු අතර වෙළඳ පොළ මිලට සාපේක්ෂව ඉහල විකුණුම් මිලකට රාජ්‍ය අංශයට අලෙවි කිරීම තුළින් සංස්ථාව අයුතු ලෙස ආදායම් උපයා තිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව මිල කැඳවීමකින් තොරව රාජ්‍ය අංශය විසින් සෘජුව සංස්ථාව වෙතින් පමණක් ඖෂධ මිලදී ගනු ලබන බවත් කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) වර්ෂ 05කටත් පෙර සිට හිඟව පැවති රු.2,510,687 ක්වූ ණය ගැනි ශේෂ 17 ක් පදනම් කර ගනිමින් රු.2,507,072 ක ප්‍රමාණයක් අඩමාන ණය සඳහා වෙන් කර තිබුණු නමුත් එම ණයගැනිගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) ලංකා බැංකු ජංගම ගිණුමේ රු.895,000ක ශේෂයක් 2023 අප්‍රේල් මස සිට නිෂ්කාර්යව පවතින අතර මෙම ජංගම ගිණුම පවත්වාගෙන යෑමේ අරමුණ කුමක්ද යන්න පිළිබඳව ලිඛිත සාක්ෂි කිසිවක් සමාලෝචිත වර්ෂයේදීද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ප්‍රමාණවත්ව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නව නිෂ්පාදනයක් වෙළඳසලට හඳුන්වා දීමට ප්‍රථම සාම්පල නිෂ්පාදනයක් සිදු කර එහි ප්‍රමිතිය පිළිබඳව තත්ත්ව සහතිකයක් ලබා ගැනීමෙන් පසු නිෂ්පාදන ක්‍රියාවලියට පිවිසිය යුතු වුවත්, තත්ත්ව පරීක්ෂාවකින් තොරව නිෂ්පාදිත සැන්ඩල්වුඩ් ෆේෂ් වොෂ් දෝෂ සහිත බැවින් පිරිවැය රු.984,045ක්වූ පිළිවෙලින් මිලි ලිටර් 100 බෝතල් 4,504ක් හා මිලි ලිටර් 50 බෝතල් 424ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණු අතර සංස්ථාව සතුව එම දෝෂ නිරාකරණය කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් මෙම නිෂ්පාදනය නවතා දැමීමට කටයුතු කර තිබුණි. එසේවුවද, මෙම නිෂ්පාදනය හේතුවෙන් සංස්ථාවට සිදු වී ඇති අලාභයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) නියැදි පරීක්ෂණ වාර්තාවේ මීතෙල්වල ඇසිට අගය අන්තර්ජාතික ප්‍රමිතිවල සඳහන් කර ඇති ප්‍රමාණයට වඩා වැඩි අගයක්වීම හේතුවෙන් නියැදි පරීක්ෂණයන් අසමත් වුවත්, සංස්ථාවේ වෛද්‍ය කමිටුව විසින් නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු බව නිර්දේශ කිරීම හේතුවෙන් නියැදි පරීක්ෂණයන් අසමත්වූ සැපයුම්කරුගෙන් අඩණ්ඩව රු.2,484,531ක් වටිනා මීතෙල් කිලෝග්‍රෑම් 2,208ක් මිලදී ගෙන තිබුණි. ඇණවුමේ සඳහන් දිනෙන් පසුව භාණ්ඩ සැපයීමේදී, සැපයුම් කාලය ඉක්මවූ සෑම සතියක් හෝ කොටසකට සියයට 1ක් හා දෙවන සතිය සඳහා සියයට 2ක් වනසේ ප්‍රමාද ගාස්තු අයකළ යුතු අතර දෙවන සතිය අවසන්වූ විට ගිවිසුම් අවලංගු කළ යුතු බව මිල කැඳවීම් ලිපියෙහි සඳහන් වුවත් ගිවිසුම් අවලංගු කිරීමෙන් තොරව කාල ප්‍රමාදය නොසලකා සියයට 2ක ප්‍රමාද ගාස්තු අයකර තිබුණි. තවද, ගෙණුම් ඇණවුම් සඳහා ගබඩාවට භාණ්ඩ ලැබීමට පෙර ඊළඟ ගෙණුම් ඇණවුම් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

(ඉ) 2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 375ක් වූවද එදිනට තිබූ කාර්යමණ්ඩලය 328ක් වූයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 13කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 51 ක් විය. ඒ අනුව පිළිවෙලින් කළමනාකරණ ,සහකාර, ප්‍රාථමික මට්ටමේ තනතුරු 17 ක්, 06 ක් හා 28 ක පුරප්පාඩු පැවතීම සංස්ථාවේ කාර්ය සාධනය කෙරෙහි බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

මෙදිනට,	සටහන	2024.12.31 රු.	2023.12.31 රු..	පුනර්-ප්‍රකාශිත 2022.12.31 රු.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියක හා උපකරණ	04	1,068,596,377	1,080,561,174	1,139,137,832
සිදු කෙරෙමින් පවතින කටයුතු	05	12,144,410	12,778,376	16,436,521
කාර්ය මණ්ඩල ණය	06.A	11,827,064	12,647,221	15,954,838
විලම්බිත බදුකරණය	17	2,479,479	-	1,804,601
		1,095,047,330	1,105,986,771	1,173,333,792
ජංගම වත්කම්				
භාණ්ඩ තොග	07	455,862,230	612,798,291	321,268,547
රත් තොග		1,841,645	1,841,645	5,561,695
කාර්ය මණ්ඩල ණය	06.B	17,012,359	18,224,190	17,458,468
විවිධ තැන්පතු	08	3,396,765	3,756,765	3,321,765
ස්ථාවර තැන්පතුවල කෙටි කාලීන ආයෝජන	09	190,065,223	112,189,375	112,131,811
වෙළඳ ණයකරුවෝ	10	187,796,981	81,173,248	145,603,836
ලැබිය යුතු මුදල - මුලා වංචා	32.A	16,915,307	-	-
වෙළඳ ණයකරුවන්ගෙන් ලද අතිරේක මුදල්		-	-	273
පෙර ගෙවුම් හා අත්තිකාරම්	11	22,242,252	14,752,864	8,757,301
ආන්තික හිඟුම		26,989,398	105,908,646	31,245,792
මුදල් හා මුදල් සමාන දෑ	12	120,680,059	132,099,419	84,066,361
		1,042,802,218	1,082,744,442	729,415,850
සමස්ත වත්කම්		2,137,849,549	2,188,731,212	1,902,749,641
අරමුදල් හා බැරකම්				
දායකත්වයන්				
දායක ප්‍රාග්ධනය		5,000,000	5,000,000	5,000,000
		5,000,000	5,000,000	5,000,000
බාහිර දායකත්වය	13			
මහා භාණ්ඩාගාරය		220,392,653	281,375,386	300,828,384
ලෝක සෞඛ්‍ය සංවිධානය		-	3,994,341	3,994,341
ආයුර්වේද අත්හදා බැලීමේ ආයතනය		-	761,274	761,274
		220,392,653	286,131,001	305,583,999
සංචිත	14			
ප්‍රාග්ධන සංචිත		1,923,741	1,923,741	1,923,741
ප්‍රති-ඇගයුම්කරණ සංචිත		834,232,183	834,232,183	830,812,289
සෙසු සංචිත		(33,472,593)	(20,510,938)	-
රත් තොග ප්‍රති ඇගයුම්කරණ සංචිතය		-	-	3,720,050
විදේශ විනිමය ප්‍රවර්ධන සංචිත		-	18,323	19,523
රඳවාගත් සංචිත		736,880,266	590,502,061	453,736,832
		1,539,563,598	1,406,165,370	1,290,212,435
මුළු අරමුදල්		1,764,956,251	1,697,296,370	1,600,796,434
බැරකම්				
ජංගම නොවන බැරකම්				
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම	15	16,905,818	23,967,056	16,773,300
බැංකු ණය - මහජන බැංකුව		8,000,001	12,000,000	16,333,334
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම	16	54,820,763	44,495,114	35,461,706
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදල - දේශීය		3,903,612	3,903,612	5,701,000
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදල - විදේශීය		190,730	130,768	-
විලම්බිත බදුකරණය	17	-	6,736,400	-
		83,820,923	91,232,950	74,269,340
ජංගම බැරකම්				
ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල		11,733,414	12,296,720	15,000,000
බැංකු ණය - මහජන බැංකුව		4,000,000	4,000,000	4,000,000
වෙළඳ ණය කිහිපයක්		123,680,025	245,096,925	149,673,262
වෙළඳ ණයකරුවන් වෙතින් ලද අතිරේක මුදල්		513,547	512,633	499,286
උපචිත වියදම්	18	57,826,289	38,193,071	32,035,761
සෙසු ජංගම බැරකම්	19	31,071,666	26,693,918	18,564,247
බදුකරණය සඳහා ප්‍රතිපාදනය	20	60,247,433	73,408,625	7,911,311
		289,072,375	400,201,892	227,683,867
මුළු අරමුදල් හා බැරකම්		2,137,849,549	2,188,731,212	1,902,749,641

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ වගකීම දරයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි. අංක 14895 දරන නිරණ අංකය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 මැයි මස 29වන දින හිඟුම් අනුමත කරන ලදි.

සභාපති | කළමනාකරණ අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාන්‍යාධිකාරී | නි.සා. මුදල් (වැ./බ.)

දිනය .....
වැදගත් හිඟුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා

	සටහන	**2024**	2023	ප්‍රති-ප්‍රකාශිත 2022
		රු.	රු.	රු.
අලෙවිය	**23**	**1,519,775,447**	1,215,283,637	935,892,860
අඩුකළා: අලෙවි පිරිවැය	**24**	**1,072,811,020**	756,212,888	722,935,119
දළ ලාභය		**446,964,427**	459,070,750	212,957,741
වෙනත් ආදායම්	**25**	**41,756,696**	42,226,122	33,357,523
		488,721,123	501,296,871	246,315,264
අඩුකළා: පාලන හා ආයතන වියදම්	**26**	**206,529,624**	177,499,487	184,922,843
අලෙවි හා බෙදාහැරීමේ වියදම්	**27**	**122,151,569**	121,898,062	103,527,768
		328,681,193	299,397,549	288,450,611
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය		**160,039,930**	201,899,323	(42,135,347)
එකතු කළා: මූල්‍ය ආදායම	**28**	**25,760,891**	19,864,257	20,635,653
අඩුකළා: මූල්‍ය වියදම්	**29**	**2,875,525**	3,677,297	4,288,793
බදුකරණයට පෙර ශුද්ධ අතිරික්තය		**182,925,296**	218,086,282	(25,788,488)
අඩුකළා: ආදායම් බදු වියදම්	**30**	**46,020,549**	76,884,979	589,810
බදුකරණයෙන් පසු ශුද්ධ අතිරික්තය		**136,904,747**	141,201,303	(26,378,298)
සෙසු විස්තීර්ණ ආදායම්				
ස්ථාවර වත්කම්වලට අදාළ ප්‍රති-ඇගයුම්කරණ ලාභය/ (අලාභය)		-	-	58,704,062
පාරිතෝෂික ප්‍රතිපාදනවලට අදාළ ආයුගණක ලාභය/ (අලාභය)		**(12,961,654)**	(20,510,938)	-
වසර සඳහා අදාළ සමස්ත සෙසු විස්තීර්ණ ආදායම		**(12,961,654)**	(20,510,938)	58,704,062
වසර සඳහා අදාළ සමස්ත විස්තීර්ණ ආදායම		**123,943,093**	120,690,365	32,325,764
කොටසක ඉපැයුම	**31**	**274**	282	(53)

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා

	සටහන	2024	2023	ප්‍රති-ප්‍රකාශිත 2022
		රු.	රු.	රු.
අමුද්‍රව්‍ය පරිභෝජනය				
ආරම්භක තොගය		**97,935,062**	96,004,550	85,399,305
ආරම්භක තොග ගැලපීම		**(91,525)**	-	-
එකතු කළා: මිලදී ගැනීම්		**519,032,176**	653,026,763	412,494,594
		616,875,713	749,031,312	497,893,900
අඩු කළා: අවසන් තොගය		**123,885,566**	97,935,062	96,004,550
අමුද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**492,990,147**	651,096,251	401,889,350
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය				
ආරම්භක තොගය		**28,099,379**	39,356,268	16,364,357
එකතු කළා: මිලදී ගැනීම්		**73,961,787**	60,613,803	72,563,300
		102,061,167	99,970,072	88,927,657
අඩු කළා: අවසන් තොගය		**36,914,549**	28,099,379	39,356,268
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**65,146,618**	71,870,693	49,571,389
දැවිතෙල් පරිභෝජන පිරිවැය				
ආරම්භක තොගය		**1,624,950**	2,568,000	1,059,750
එකතු කළා: මිලදී ගැනීම්		**43,942,280**	68,174,213	66,049,522
		45,567,230	70,742,213	67,109,272
අඩු කළා: අවසන් තොගය		**1,407,600**	1,624,950	2,568,000
දැවිතෙල් පරිභෝජන පිරිවැය		**44,159,630**	69,117,263	64,541,272
සෘජු ශ්‍රම පිරිවැය	**21**	**152,093,137**	138,168,177	119,866,376
ප්‍රධාන පිරිවැය		**754,389,531**	930,252,383	635,868,386
කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය				
වක්‍ර පිරිවැය	**22**	**129,756,676**	129,651,595	108,655,904
එකතු කළා: ආරම්භක නිම නොකළ		**21,234,120**	20,691,648	21,926,628
අඩු කළා: අවසන් නිම නොකළ		**21,645,286**	21,234,120	20,691,648
		129,345,510	129,109,123	109,890,884
වසරේ සමස්ත නිෂ්පාදන පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය වෙත ඉදිරියට ගෙන යන ලදි		**883,735,041**	1,059,361,507	745,759,270

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.
වරහන් තුළ එන සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා

	2024	2023	ප්‍රති-ප්‍රකාශිත 2022
	රු.	රු.	රු.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය			
බදුකරණයට පෙර ශුද්ධ අතිරික්තය	**182,925,296**	218,086,282	(25,788,488)
ගැලපීම්			
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	**(7,061,238)**	7,193,755	8,298,643
දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම	**56,738,566**	63,131,002	57,091,291
භාණ්ඩාගාර අරමුදල් ක්‍රමක්ෂය (ක්ෂයවීම)	**(18,622,341)**	(19,452,999)	(19,487,730)
සේවක ප්‍රතිලාභ ගැලපීම්	**9,012,864**	7,140,077	4,522,773
පෙර වසර ගැලපීම්	**5,351,809**	(4,052,793)	(8,918,378)
නරක් වූ සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන	**319,929**	(9,132)	-
පොළී ආදායම	**(21,700,135)**	(16,126,082)	-
ස්ථාවර තැන්පතුවල ආයෝජනය - මුදල් නොවන ප්‍රමාණය	-	2,506,031	(9,555,896)
	206,964,750	258,416,141	6,162,215
කාරක ප්‍රාග්ධනය මාරු කිරීමට පෙර ලාභය			
වැඩිවීම් / (අඩුවීම්) භාණ්ඩ තොග	**156,936,061**	(291,529,744)	(60,978,530)
වැඩිවීම් / (අඩුවීම්) කාර්ය මණ්ඩල ණය	**2,031,988**	2,541,895	(5,472,244)
වැඩිවීම් / (අඩුවීම්) පෙර ගෙවුම් සහ අත්තිකාරම්	**(4,819,757)**	(5,233,882)	11,141,590
වැඩිවීම් / (අඩුවීම්) විවිධ තැන්පතු	**360,000**	(435,000)	(74,025)
වැඩිවීම් / (අඩුවීම්) වෙළඳ ණයකරුවෝ	**(106,943,662)**	64,439,721	(35,938,145)
වැඩිවීම් / (අඩුවීම්) ආන්තික ගිණුම්	**78,919,248**	(74,662,854)	(11,935,681)
වැඩිවීම් / (අඩුවීම්) වෙළඳ ණය හිමියන්ගෙන් ලත් අතිරික්ත මුදල්	-	273	-
වැඩිවීම් / (අඩුවීම්) වෙළඳ ණය හිමියෝ	**(121,416,900)**	95,423,662	71,801,234
වැඩිවීම් / (අඩුවීම්) වෙනත් ජංගම බැරකම්	**4,377,748**	8,129,671	4,328,424
වැඩිවීම් / (අඩුවීම්) උපචිත වියදම්	**19,633,218**	6,157,310	(3,872,613)
වැඩිවීම් / (අඩුවීම්) වෙළඳ ණයකරුවන් වෙතින් ලද අතිරික්ත මුදල්	**914**	13,347	4,419
වැඩිවීම් / (අඩුවීම්) වෙළඳ නියෝජිත රක්ෂණ අරමුදල - දේශීය	-	(1,797,388)	5,701,000
වැඩිවීම් / (අඩුවීම්) වෙළඳ නියෝජිත රක්ෂණ අරමුදල - විදේශීය	**59,962**	130,768	-
වැඩිවීම් / (අඩුවීම්) විදේශ විනිමය ගැලපුම් සංචිත	**(18,323)**	(1,200)	-
වැඩිවීම් / (අඩුවීම්) ජාතික සෞඛ්‍ය අරමුදල	**(563,306)**	-	-
ලැබිය යුතු මුදල - මූල්‍ය වංචා	**(16,915,307)**	-	-
	218,606,634	61,592,721	(19,132,355)
අඩු කළා: ගෙවූ පාරිතෝෂික	**(11,648,870)**	(18,617,608)	(2,347,402)
ගෙවූ බදු	**(68,397,620)**	(2,846,664)	-
මෙහෙයුම් කටයුතුවලින් එන ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**138,560,145**	40,128,449	(21,479,758)
ආයෝජන කටයුතුවලින් එන මුදල් ප්‍රවාහයන්			
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම්	**(45,407,736)**	(4,554,344)	(63,204,487)
සිදු කෙරෙමින් පවත්නා කටයුතුවලට අදාළ (ආයෝජනය) / ප්‍රාග්ධනීකරණය	**633,966**	3,658,145	(4,292,111)
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	**(77,875,848)**	(2,563,595)	75,284,257
ලත් පොළිය	**19,030,504**	15,364,402	
ආයෝජන කටයුතුවලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(103,619,114)**	11,904,608	7,787,659
මූල්‍ය කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාර බදු ගෙවීම්	**(42,360,391)**	-	-
බැංකු ණය ලබාගත්/ (ආපසු ගෙවීම්)	**(4,000,000)**	(4,000,000)	(4,000,000)
මූල්‍ය කටයුතුවලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(46,360,391)**	(4,000,000)	(4,000,000)
මුදල් හා මුදල් සමාන දෑ ආශ්‍රිත ශුද්ධ වර්ධනය / (අඩුවීම්)	**(11,419,360)**	48,033,058	(17,692,099)
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	**132,099,419**	84,066,361	101,758,461
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**120,680,059**	132,099,419	84,066,361

දෙසැම්බර් 31 දිනට	**2024**	2023	2022
	රු.	රු.	රු.
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.ඇ. 097-1001-82315453	**50,178,136**	29,548,576	4,739,076
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.ඇ. 097-1002-72315453	**17,135,839**	12,267,723	10,674,353
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.ඇ. 097-1003-62315453	**15,031,921**	45,107,253	40,774,959
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.ඇ. 097-2004-32315453	**2,660,593**	23,770,220	12,925,761
මහජන බැංකුව - ගංගොඩවිල - ඉතුරුම් ගිණුම	**15,376,451**	14,452,333	7,030,637
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.ඇ. 097-4023-62315453	**389,462**	129,568	-
ලංකා බැංකුව - ආයතනික - ගි.ඇ.00001209	**19,012,656**	5,928,747	5,721,575
ලංකා බැංකුව - ආයතනික ශාඛාව - ගි.ඇ. 87653784	**895,000**	895,000	2,200,000
	120,680,059	132,099,419	84,066,361

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.
වරහන් තුළ එන සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

සම් කොටස් විවලන ප්‍රකාශනය

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා

ප්‍රති-ප්‍රකාශිත

	2024.01.01 දිනට ශේෂය	පෙර වසර ගැලපීම්	විනිමය අලාභය	භාණ්ඩාගාර අරමුදල ක්‍රමක්ෂය - (සටහන 13.1)	භාණ්ඩාගාර බදු ප්‍රමාණය	ආයුගණක ලාභය / (අලාභය)	වසර සඳහා වූ ශුද්ධ අතිරික්තය	2024.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**5,000,000**	-	-	-	-	-	-	**5,000,000**
මහා භාණ්ඩාගාරය	**281,375,386**	-	-	(18,622,341)	(42,360,391)	-	-	**220,392,653**
ලෝක සෞඛ්‍ය සංවිධානය	**3,994,341**	(3,994,341)	-	-	-	-	-	-
ආයුර්වේද අත්හදා බැලීමේ ආයතනය	**761,274**	(761,274)	-	-	-	-	-	-
ප්‍රාග්ධන සංචිත	**1,923,741**	-	-	-	-	-	-	**1,923,741**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - ඉඩම්	**517,677,685**	-	-	-	-	-	-	**517,677,685**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - ගොඩනැගිලි	**161,457,187**	-	-	-	-	-	-	**161,457,187**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - යන්ත්‍රෝපකරණ	**53,431,185**	-	-	-	-	-	-	**53,431,185**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - ජල සම්පාදන උපකරණ	**14,678,456**	-	-	-	-	-	-	**14,678,456**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - රසායනාගාර උපකරණ	**476,874**	-	-	-	-	-	-	**476,874**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - මෝටර් වාහන	**82,772,470**	-	-	-	-	-	-	**82,772,470**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - භාණ්ඩ තොගය	**1,927,561**	-	-	-	-	-	-	**1,927,561**
ප්‍රති-ඇගයුම්කරණ සංචිතය - 2017 වසරට පෙර	**1,810,765**	-	-	-	-	-	-	**1,810,765**
විදේශ මුදල් වර්ධන සංචිත	**18,323**	-	(18,323)	-	-	-	-	-
වෙනත් සංචිත	**(20,510,938)**	-	-	-	-	(12,961,654)	-	**(33,472,593)**
රඳවාගත් ඉපැයුම්	**590,502,061**	9,473,458	-	-	-	-	136,904,747	**736,880,266**
එකතුව	**1,697,296,370**	**4,717,843**	**(18,323)**	**(18,622,341)**	**(42,360,391)**	**(12,961,654)**	**136,904,747**	**1,764,956,251**

පහත සඳහන් සාරාංශගත ගැලපීම් හේතුකොට පෙර වසරට අදාළව රු.9,473,458ක ගැලපීම් ඇතිවිය.

	රු.
ණයකරු ආශ්‍රිත ගැලපීම්	72,821
අමුද්‍රව්‍ය ආශ්‍රිත ගැලපීම්	91,525
හානිවූ භාණ්ඩ සඳහා ගැලපීම්	3,185,743
සිදු කෙරෙමින් පවත්නා කටයුතු සඳහා ගැලපීම්	6,550
ලෝක සෞඛ්‍ය සංවිධාන අරමුදල් ගැලපීම්	(3,994,341)
ආයුර්වේද පර්යේෂණ ගැලපීම්	(761,274)
ලෝක සෞඛ්‍ය සංවිධානයට සිදු කෙරෙමින් පවත්නා කටයුතු අත්තිකාරම ගැලපීම	3,000,000
වියදම් ආශ්‍රිත ගැලපීම්	895,016
මිලදී ගැනීම් ආශ්‍රිත ගැලපීම්	(11,969,498)
	(9,473,458)

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.
මූල්‍ය ප්‍රකාශන සටහන් – 2024

1. **සාමාන්‍ය තොරතුරු**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව (ශ්‍රී ලං.ආ.ඖ.සං.) 1969 දී 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1969 මැයි 11 දිනැති අංක 14853/1 දරන රජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංස්ථාගත කරන ලදී. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය මහරගම, නාවින්න, පැරණි කොට්ටාව පාරේ අංක 94 දරන ස්ථානයෙහි පිහිටා ඇත.

ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම් ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ආයුර්වේද ඖෂධ සහ ඖෂධ නිෂ්පාදනය කිරීම සහ ඒවා රජයේ රෝහල්, ආයුර්වේද වෛද්‍යවරුන් සහ පෞද්ගලික අංශයට අලෙවි කිරීමයි.

2024 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථා කාර්ය මණ්ඩලය 329 (2023-378) කි.

2. සැකසුම් පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සම කොටස් විචලන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (“මූල්‍ය ප්‍රකාශන”) ඇතුළත් මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් නියම කර ඇති පරිදි නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS / LKAS) සහ ශ්‍රී ලංකා රජය විසින් සකස් කරන ලද මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන 2025 මැයි 29 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී (අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංකය: 14895).

2.2 මිනුම් පදනම
මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

2.3 ක්‍රියාත්මක හා ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක් බව
අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට අපේක්ෂා කළ හැකි අනාගතයේදී අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර සංස්ථාවේ ක්‍රියාකාරකම් ඇවර කිරීමේ හෝ නැවැත්වීමේ අවශ්‍යතාවයක් ඔවුන් අපේක්ෂා නොකරයි.

2.4 සාපේක්ෂ තොරතුරු
පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය, අදාළ අවස්ථාවන්හිදී, වඩා යහපත් ඉදිරිපත් කිරීමක් සඳහා සහ වත්මන් වර්ෂයේ ඒවා සමඟ සැසඳිය හැකි වන පරිදි සංශෝධනය කර ඇත.

2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීම සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම් ආදායම් සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම්, ප්‍රවණතා සහ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළුව අනෙකුත් සාධක මත වේ. ඒ අනුව, සත්‍ය ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒ පදනම්ගත උපකල්පන ඒවායේ වලංගුභාවය සහතික කිරීම සඳහා අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල සීමාව තුළ සහ බලපෑමට ලක් වූ ඕනෑම අනාගත කාල පරිච්ඡේදයකදී ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන හඳුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණයන් කෙරෙහි වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් කර ඇත:

සටහන 16- අර්ථ නිරූපිත ප්‍රතිලාභ බැඳීම් මැනීම.

සටහන 17 - විලම්බිත බදුකරණය

2.6 විදේශ මුදල් ගනුදෙනු

(අ) ක්‍රියාත්මක හා ඉදිරිපත් කිරීමට අදාළ මුදල් ඒකකය

සංස්ථාව මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය (ක්‍රියාකාරී මුදල් ඒකකය) භාවිතා කරමිනි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් (LKR) ඉදිරිපත් කර ඇති අතර එය සංස්ථාවේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වේ.

(ආ) ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ගනුදෙනු, ගනුදෙනු සිදු වූ දිනවල පවතින විනිමය අනුපාත භාවිතා කරමින් ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ.

03. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කරන ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් සඳහන් කළහොත් විනා, මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කරන ලද සියලුම වර්ෂ සඳහා අඛණ්ඩව අදාළ කර ඇත.

3.1 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වන්නේ මුදල්, බැංකු ශේෂයන් සහ සංස්ථාවේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ වාර්තා කරන දින සිට වසරක් ඇතුළත, මුදල් වශයෙන් උපයා ගැනීමට අපේක්ෂා කරන වත්කම් ය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් යනු සංස්ථාව වාර්තා කරන දින සිට වසරක කාලයක් ඉක්මවා තබා ගැනීමට අදහස් කරන වත්කම් ය.

3.1.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1.1 හඳුනා ගැනීම සහ මිනුම්කරණය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැයට එහි මිලදී ගැනීමේ මිල සහ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ඕනෑම පිරිවැයක් ඇතුළත් වේ.

ස්වයං-නිර්මිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක් ඇතුළත් වේ. මෙයට අයිතම ගලවාලීම සහ ඉවත් කිරීම සහ ඒවා පිහිටා ඇති ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය සහ සුදුසුකම් ලත් වත්කම් සඳහා ණයට ගැනීමේ පිරිවැය ද ඇතුළත් වේ.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක කොටස්වල එකිනෙකට විවිධවූ ප්‍රයෝජනවත් ආයු කාලයන් ඇති විටදී, ඒවා දේපල, පිරියත සහ උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.

පවත්නා ලේඛනගත වටිනාකම පියවාගත නොහැකි විය හැකි බවට පවත්නා තත්ත්ව විපර්යාසයන් හෝ අවස්ථාවන් විසින් දක්වනු ලබන විටදී සිදුවී ඇති හානි කවරේද යන්න විමසනු පිණිස දේපළ, පිරියත හා උපකරණයන්හි ලේඛනගත වටිනාකම සමාලෝචනය කරනු ලැබේ. යම් වත්කමක ලේඛනගත වටිනාකම එහි ඇස්තමේන්තුගත පියවාගත හැකි වටිනාකමට වඩා වැඩි අගයක් ගන්නේ නම් එහි ලේඛනගත වටිනාකම වහා එහි පියවාගත හැකි වටිනාකම දක්වා තක්සේරු කොට සටහන් කරනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී ලැබෙන ලාභ සහ අලාභ, බැහැර කිරීමෙන් ලැබෙන ආදායම සහ දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ ප්‍රමාණය අතර වෙනස ලෙස තීරණය කරනු ලබන අතර, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනා ගනු ලැබේ.

3.1.1.2 තදනන්තර පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා ඒමට ඉඩ තිබේ නම් සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, අයිතමයේ ලේඛනගත සැබෑ වටිනාකමින් හඳුනා ගැනේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ලේඛනගත මුදල ගණනයෙන් ඉවත් කෙරේ.

දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා පිරිවැය ලාභ හෝ අලාභයෙන් දැරූ ලෙස හඳුනා ගැනේ.

3.1.1.3 ගණනයෙන් ඉවත් කිරීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක ලේඛනගත වටිනාකම එම අයිතමය ඉවත් කිරීමේදී හෝ එය භාවිතයෙන් හෝ ඉවත් කිරීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන තැන්හිදී ගණනයෙන් ඉවත් කරනු ලැබේ. ගණනයෙන් ඉවත් කිරීමට අදාළ ලාභාලාභ ලාභාලාභ තුළ එන සෙසු ආදායම් තුළට යොදා හඳුනාගනු ලැබේ.

3.1.1.4 නරක් වූ හා අඩමාන ණය

නරක්වූ ණය

අදාළ මුදල් ප්‍රමාණය පියවාගත නොහැකි බවට තහවුරු වූ විටදී නරක් වූ ණය ලාභාලාභ ගිණුමේ වියදමක් වශයෙන් හඳුනාගනු ලබයි.

අඩමාන ණය

අඩමාන ණය සම්පාදනය විසින් ඉතිරි ශේෂයක් පසුගිය වසර පහකට අධික කාලයක් පුරා පවත්වාගෙන ඒමට හේතුවිය.

3.1.1.5 ණය ගැනීමේ පිරිවැය

එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට සැලකිය යුතු කාල පරිච්ඡේදයක් ගතවන, සුදුසු වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැයේ මුදල් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 - ණය ගැනීමේ පිරිවැය යටතේ එ ා හා අනුකූලව තීරණය කරනු ලැබේ.

ප්‍රාග්ධනීකරණය නොකරන ලද ණය ගැනීමේ පිරිවැය ඒවා සිදු වන කාල සීමාව තුළ වියදම් ලෙස හඳුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ අයවීම් වශයෙන් දක්වනු ලැබේ.

3.1.1.6 ක්ෂය වීම

ක්ෂය වීම ගණනය කරනු ලබන්නේ ක්ෂයකළ හැකි මුදල මත වන අතර, එය වත්කමක පිරිවැය හෝ පිරිවැය වෙනුවට ආදේශ කරන ලද වෙනත් මුදලකින් එහි ඉතිරි වටිනාකම අඩුකළ විට ලැබෙන අගයයි. ක්ෂයකරණය ලාභාලාභයේ සෘජු රේඛීය පදනම මත දේපල, ස්ථාවර වත්කම් සහ උපකරණවල එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත හඳුනාගනු ලැබේ, මන්ද මෙය වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාව වඩාත් සමීපව පිළිබිඹු කරන්නක් වන බැවිනි.

සංස්ථාවට බදු කාලසීමාව අවසානයේ හිමිකාරිත්වය හිමිවනු ඇතැයි සාධාරණ ලෙස නිශ්චිත නම් මිස බදු දුන් වත්කම් බදු කාලසීමාව සහ ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය යන කාල පරිච්ඡේද දෙක අතුරින් වඩාත් කෙටි කාලයට ක්ෂයකරණය කරනු ලැබේ. ඉඩම් ක්ෂයකරණය නොකෙරේ. මෙම සංස්ථාවට අදාළ බදු දෙන ලදි වත්කම් නොමැත.

වර්තමාන සහ සන්සන්දනාත්මක කාල සීමා සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයකරණ අනුපාත පහත පරිදි වේ:

වත්කම් ප්‍රවර්ගය	ප්‍රයෝජනවත් ආයු කාලය (අවුරුදු)	ක්ෂය වීමේ අනුපාතය (%)
ගොඩනැගිලි	අවුරුදු 20	5%
යන්ත්‍ර සූත්‍ර	අවුරුදු 6.66	15%
ජල සැපයුම් උපකරණ	අවුරුදු 6.66	15%
රසායනාගාර උපකරණ	අවුරුදු 6.66	15%
කාර්යාල උපකරණ	අවුරුදු 10	10%
මෝටර් රථ	අවුරුදු 5	20%
මෙවලම් සහ උපකරණ	අවුරුදු 3	33.33%

වත්කමක් භාවිතය සඳහා ලබා ගත හැකි වූ විට වත්කමක ක්ෂයකරණය ආරම්භ වන අතර, වත්කම විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කරන ලද දිනය සහ වත්කම පොත්පත් ලේඛනයන්ගෙන් ඉවත් කරන ලද දිනය අතුරින් පූර්ව දිනයේ වත්කමක ක්ෂයකරණය නතර වේ.
ක්ෂයකරණ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ වටිනාකම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර සුදුසු නම් ගලපනු ලැබේ.

3.1.1.7 සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කටයුතු

වාර්තාකරන දිනය වන විට සම්පූර්ණ නොකළ වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන කටයුතු - සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කටයුතු ලෙස පෙන්වනු ලබන අතර, වර්ෂය තුළ සම්පූර්ණ කර භාවිතයට ගත් ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කර ඇත.

3.1.1.8 මූල්‍ය ලේඛන - ආරම්භක හඳුනාගැනීම සහ පසුකාලීනව මැනීම

මූල්‍ය ලේඛනයක් යනු එක් ආයතනයක මූල්‍ය වත්කමක් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීමක් හෝ කොටස් ලේඛනයක් ඇති කරන ඕනෑම කොන්ත්‍රාත්තුවකි.

මූල්‍ය වත්කම්

ආරම්භක හඳුනාගැනීම සහ මැනීම

මූල්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේදී වර්ගීකරණය කරනු ලබන්නේ පසුකාලීනව ක්ෂයකළ පිරිවැයෙන්, සාධාරණ වටිනාකම් වෙනත් විස්තීරණ ආදායම් (OCI) හරහා සහ සාධාරණ වටිනාකම් ලාභ හානිය හරහා මැනීමටය.

ආරම්භක හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය රඳා පවතින්නේ මූල්‍ය වත්කමේ කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා සමාගමේ පවත්නා ව්‍යාපාර ආකෘතිය මතය. සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක් අඩංගු නොවන හෝ සමාගම ප්‍රායෝගික පහසුව යෙදූ වෙළඳ ලැබිය යුතු දෑ හැරුණු විට, ලාභ හානිය හරහා සාධාරණ වටිනාකමෙන් නොවන මූල්‍ය වත්කමක් නම්, ගනුදෙනු පිරිවැය ඇතුළත්ව, සමාගම මූලිකව මූල්‍ය වත්කමක් එහි සාධාරණ වටිනාකමෙන් ප්‍රමාණය කරනු ලබයි.

මූල්‍ය වත්කමක් ක්ෂයකළ පිරිවැයෙන් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමෙන් වර්ගීකරණය කර මැනීම සඳහා, එය ඉතිරිව ඇති ප්‍රධාන මුදල මත 'හුදෙක් ප්‍රාග්ධන සහ පොලී ගෙවීම් (SPPI)' වන මුදල් ප්‍රවාහ ඇති කළ යුතුය. මෙම තක්සේරුව SPPI පරීක්ෂණය ලෙස හඳුන්වනු ලබන අතර මූල්‍ය ලේඛන හෙවත් සාධන පත්‍ර මට්ටමකින් සිදු කරනු ලැබේ. මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ව්‍යාපාර ආකෘතිය යන්නෙන් මුදල් ප්‍රවාහ උත්පාදනය කිරීම සඳහා එය එහි මූල්‍ය වත්කම් කළමනාකරණය කරන ආකාරය අදහස් කෙරේ. ව්‍යාපාර ආකෘතිය විසින් මුදල් ප්‍රවාහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම, මූල්‍ය වත්කම් විකිණීම හෝ එම දෙකෙහිම ප්‍රතිඵලයක් වනු ඇත්ද යන්න තීරණය කරනු ලබයි.

වෙළඳපොළේ නියාමනයකින් හෝ සම්මුතියකින් ස්ථාපිත කරන ලද කාල රාමුවක් තුළ වත්කම් බෙදා හැරීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකුණුම් (සාමාන්‍ය මාර්ග වෙළඳාම්) වෙළඳ දිනයේ, එනම්, සමාගම වත්කම මිලදී ගැනීමට හෝ විකිණීමට කැපවන දිනයේදී හඳුනාගනු ලැබේ.

පසුකාලීන මැනීම

පසුකාලීන මැනීමේ අවශ්‍යතාවයන් සඳහා, මූල්‍ය වත්කම් ප්‍රවර්ග හතරකට වර්ගීකරණය කරනු ලැබේ:

1. ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය සාධනපත්‍ර)
2. සමුච්චිත ලාභ සහ පාඩු ප්‍රතිවක්‍රීකරණය සමඟ වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම් (ණය සාධනපත්‍ර)
3. ඉවත් කිරීම් කරන විට සමුච්චිත ලාභ සහ පාඩු ප්‍රතිවක්‍රීකරණයකින් තොරව වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට නම් කරන ලද මූල්‍ය වත්කම් (කොටස් සාධනපත්‍ර)
4. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම්.

කෙසේ වෙතත්, සමාගමේ මූල්‍ය වත්කම් වර්ගීකරණය ක්ෂයකළ පිරිවැයෙන් මූල්‍ය වත්කම් (ණය සාධනපත්‍ර) සහ සෙසු විස්තීර්ණ ආදායම්වලට සාධාරණ අගයට (FVOCI) නම් කරන ලද මූල්‍ය වත්කම් (කොටස් සාධනපත්‍ර) වලට සීමා වේ.

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය සාධනපත්‍ර)

මෙම කාණ්ඩය සමාගමට වඩාත්ම අදාළ වේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ගන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් ක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලබයි:

- කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් රඳවා තබා ගැනීමේ අරමුණින් යුත් ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම රඳවා තබා ගනු ලබන අතර
- මූල්‍ය වත්කමෙහි කොන්ත්‍රාත් නියමයන් නිශ්චිත දිනයන්හිදී ප්‍රධාන මුදල සහ ඉතිරිව පවතින ප්‍රධාන මුදලට පොලිය පමණක් වන මුදල් ප්‍රවාහයන් ඇති කරයි.

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන මූල්‍ය වත්කම් පසුව ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා හානි අන්තර්ගත වීමට යටත් වේ. වත්කම වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමේදී, වෙනස් කිරීමේදී හෝ හානි වූ විට ලාභ සහ අලාභ ලාභාලාභ ගිණුමෙහි හඳුනාගනු ලැබේ.

සමාගමේ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන මූල්‍ය වත්කම්වලට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ, බැංකුගත මුදල් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති ණය ඇතුළත් වේ.

වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට නම් කරන ලද මූල්‍ය වත්කම් (කොටස් සාධනපත්‍ර)

ආරම්භක පිළිගැනීමේදී, සමාගමට එහි කොටස් ආයෝජන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 32 මූල්‍ය උපකරණ: ඉදිරිපත් කිරීම යටතේ කොටස් නිර්වචනයට අනුරූප වන විට සහ වෙළඳාම සඳහා රඳවාගෙන නොමැති විට වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් කොටස් සාධනපත්‍ර ලෙස ආපසු හැරවිය නොහැකි ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගත හැකිය. වර්ගීකරණය සාධනපත්‍රයෙන් පත්‍රය පදනමින් තීරණය කරනු ලැබේ.

මෙම මූල්‍ය වත්කම් මත ඇති වන ලාභ සහ අලාභ කිසි විටෙකත් ලාභාලාභ ගිණුමට ප්‍රතිවර්ගීකරණය නොකෙරේ. ගෙවීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ලාභාලාභ ගිණුමෙහි මූල්‍ය ආදායම ලෙස පිළිගනු ලැබේ, සමාගම එවැනි ප්‍රතිලාභවලින් මූල්‍ය වත්කමෙහි පිරිවැයෙන් කොටසක් පියවා ගැනීමක් ලෙස ප්‍රතිලාභ ලබන අවස්ථා හැර, එවැනි අවස්ථාවලදී එවැනි ලාභ සෙසු විස්තීර්ණ ආදායම්හි වාර්තා කෙරේ. සෙසු විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද කොටස් සාධනපත්‍ර හානි තක්සේරුවට යටත් නොවේ.

සමාගම විසින් මෙම කාණ්ඩය යටතේ එහි ලැයිස්තුගත කොටස් ආයෝජන ආපසු හැරවිය නොහැකි ලෙස වර්ගීකරණය කිරීමට තෝරා ගන්නා ලදී.

හඳුනාගැනීම ඉවත් කිරීම හෙවත් වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීම

පහත අවස්ථාවන්හිදී මූල්‍ය වත්කමක් (හෝ, අදාළ වන විට, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) මූලික වශයෙන් හඳුනාගැනීම ඉවත් කරනු ලබයි (එනම්, සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කරනු ලබයි):

- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇති විට, හෝ
- සමාගම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම මාරු කර ඇති හෝ 'මාරු කිරීමේ' විධිවිධානයක් යටතේ තුන්වන පාර්ශ්වයකට ලැබුණු මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන්ම ගෙවීමට බැඳීමක් භාර ගෙන ඇති අතර, එ් අනුව
  (අ) සමාගම වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට, හෝ
  (ආ) සමාගම වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ මාරු කර හෝ රඳවා ගෙන නොමැති නමුත් වත්කමෙහි පාලනය මාරු කර ඇති විට.

මූල්‍ය වත්කම්වලට හානි සිදුවීම

සමාගම ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමකින් රඳවාගෙන නොමැති සියලුම ණය සාධනපත්‍ර සඳහා අපේක්ෂිත ණය පාඩු (ECLs) සඳහා දීමනාවක් හඳුනා ගනී. අපේක්ෂිත ණය පාඩු පදනම් වන්නේ කොන්ත්‍රාත්තුවට අනුකූලව ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ සහ සමාගම ලබා ගැනීමට අපේක්ෂා කරන මුල් ඵලදායී පොලී අනුපාතයේ ආසන්න අගයකින් වට්ටම් කරනු ලැබූ සියලුම මුදල් ප්‍රවාහ අතර වෙනස මත වේ. අපේක්ෂිත මුදල් ප්‍රවාහයට කොන්ත්‍රාත් නියමයන්ට ඇතුළත් වන ලෙස රඳවාගෙන ඇති ඇපකර විකිණීමෙන් හෝ වෙනත් ණය වර්ධනයන්ගෙන් ලැබෙන මූල්‍ය ප්‍රවාහ ඇතුළත් වේ.

අපේක්ෂිත ණය පාඩු අදියර දෙකකින් හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදු නොවී ඇති ණය නිරාවරණ සඳහා, ඉදිරි මාස 12 තුළ (මාස 12-ක අපේක්ෂිත ණය පාඩු) ඇතිවිය හැකි ගෙවීම් පැහැර හැරීම් සිදුවීම්වලින් ඇති වන ණය පාඩු සඳහා අපේක්ෂිත ණය පාඩු සපයනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදුවී ඇති එම ණය නිරාවරණ සඳහා, පැහැර හැරීමේ කාලය නොතකා (ආයු කාලීන අපේක්ෂිත ණය පාඩු), නිරාවරණයේ ඉතිරි ආයු කාලය පුරා අපේක්ෂිත ණය පාඩු සඳහා පාඩු දීමනාවක් අවශ්‍ය වේ.

වෙළඳමය ලැබීමට ඇති දෑ සහ කොන්ත්‍රාත් වත්කම් සඳහා, සමාගම අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේදී සරල ප්‍රවේශයක් යොදයි. එබැවින්, සමාගම ණය අවදානමෙහි වෙනස්කම් නිරීක්ෂණය නොකරන නමුත් ඒ වෙනුවට එක් එක් වාර්තාකරන දිනයේදී ආයු කාලීන අපේක්ෂිත ණය පාඩු පදනම් කරගත් පාඩු දීමනාවක් හඳුනාගනී. සමාගම ණයගැතියන්ට සහ ආර්ථික පරිසරයට විශේෂිතව අනාගත සාධක සඳහා සකස් කරන ලද, එහි ඓතිහාසික ණය පාඩු අත්දැකීම් මත පදනම් වූ ප්‍රතිපාදන න්‍යාසයක් ස්ථාපිත කර ඇත.

කොන්ත්‍රාත් ගෙවීම් දින 365 ක් කල් ඉකුත් වූ විට සමාගම මූල්‍ය වත්කමක් පැහැර හැර ඇති ලෙස සලකයි. කෙසේ වෙතත්, ඇතැම් අවස්ථාවලදී, අභ්‍යන්තර හෝ බාහිර තොරතුරු මඟින් සමූහය විසින් රඳවාගෙන ඇති ඕනෑම ණය වර්ධනයක් සැලකිල්ලට ගැනීමට පෙර සමූහයට සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල් ලැබීමට ඇති හැකියාව අඩු බව පෙන්වන විට සමාගමට මූල්‍ය වත්කමක් පැහැර හැර ඇති ලෙස සැලකිය හැකිය. කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් නොමැති විට මූල්‍ය වත්කමක් කපා හරිනු ලැබේ.

මූල්‍ය වගකීම්

ආරම්භක පිළිගැනීම සහ මැනීම

මූල්‍ය වගකීම්, ආරම්භක හඳුනාගැනීමේදී, ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම්, ණය සහ ණය ගැනීම්, ගෙවිය යුතු මුදල්, හෝ ඵලදායී ආවරණයක් තුළ ආවරණ සාධනපත්‍ර ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස, අදාළ පරිදි වර්ගීකරණය කෙරේ.

සියලුම මූල්‍ය වගකීම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගනු ලබන අතර, ණය සහ ණය ගැනීම් සහ ගෙවිය යුතු දෑ සම්බන්ධයෙන් ගත්කල, සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය ඉවත් කර හඳුනාගනු ලබයි.

සමාගමේ මූල්‍ය වගකීම් තුළට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු අයිරා, ණය සහ ණය ගැනීම් සහ වෙනත් මූල්‍ය වගකීම් ඇතුළත් වේ.

පසු මැනීම

මූල්‍ය වගකීම් මැනීම පහත විස්තර කර ඇති පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

ණය සහ ණය ගැනීම්

මෙය සමාගමට වඩාත්ම අදාළ කාණ්ඩයයි. ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව, පොලී සහිත ණය සහ ණය ගැනීම් පසුව ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලැබේ. වගකීම් වත්කම් ලේඛනයෙන් ඉවත් කරන විට මෙන්ම ඵලදායී පොළී අනුපාත ක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා ලාභ සහ අලාභ ලාභාලාභ ගිණුමෙහි හඳුනා ගනු ලැබේ.

අත්පත් කර ගැනීමේදී ඇති ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ ඵලදායී පොළී අනුපාතයන් හි අනිවාර්ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කෙරේ. ඵලදායී පොළී අනුපාත ක්‍රමක්ෂය කිරීම ලාභාලාභ ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය ලෙස ඇතුළත් වේ.

වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීම

වගකීම යටතේ ඇති බැඳීම ඉටු කළ විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වන විට මූල්‍ය වගකීම වත්කම් ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ. පවතින මූල්‍ය වගකීමක් එම ණය දෙන්නා විසින් සැලකිය යුතු ලෙස වෙනස් නියමයන් මත තවත් එකකින් ප්‍රතිස්ථාපනය කරන විට, හෝ පවතින වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීම සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලැබේ. අදාළ ඉදිරියට ගෙන යන මුදල් ප්‍රමාණයන්හි වෙනස ලාභාලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

මූල්‍ය සාධනපත්‍ර සමතුලනය කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමතුලනය කරනු ලබන්නේ, පිළිගත් මුදල් සමතුලනයකට වර්තමානයේ බලාත්මක කළ හැකි නීතිමය අයිතියක් තිබේ නම් සහ ශුද්ධ පදනමක් මත විසඳීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට සහ එකවරම වගකීම් පියවීමට අභිප්‍රායක් තිබේ නම් පමණි.

මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු පාරිභෝගිකයෙකු හෝ මූල්‍ය ලේඛනයක ප්‍රති-පාර්ශ්වයක් එහි කොන්ත්‍රාත් බැඳීම් ඉටු කිරීමට අසමත් වුවහොත් සංස්ථාවට ඇති විය හැකි මූල්‍ය පාඩුවේ අවදානම වන අතර එය ප්‍රධාන වශයෙන් පාරිභෝගිකයන්ගෙන් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් සංස්ථාවට ලැබීමට ඇති මුදල්වලින් පැන නගී. වෙළඳ හා වෙනත් ලැබීමට ඇති දෑ සහ ආයෝජන සම්බන්ධයෙන් සිදු වූ පාඩු පිළිබඳ සිය ඇස්තමේන්තුව නියෝජනය කරන දුර්වලතා සඳහා දීමනාවක් සංස්ථාව ස්ථාපිත කරයි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් විසඳනු ලබන එහි මූල්‍ය වගකීම් හා සම්බන්ධ බැඳීම් ඉටු කිරීමේදී සංස්ථාව අපහසුතාවයට මුහුණ දෙන අවදානමයි. ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා සංස්ථාවේ ප්‍රවේශය වන්නේ, සාමාන්‍ය සහ ආතතිමය තත්ත්වයන් යටතේ, පිළිගත නොහැකි පාඩු සිදු නොවන ලෙස හෝ සංස්ථාවේ කීර්තියට හානි සිදුවීමේ අවදානමකින් තොරව, වගකීම් කල් ඉකුත් වන විට ඒවා ඉටු කිරීමට සෑම විටම ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වාගනු ලබන බව සහතික කිරීමයි.

3.1.1.9 තොග

තොග මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙ අගයෙන් අඩු අගයෙනි. සමාගම විසින් ශුද්ධ උපලබ්ධි වටිනාකම (NRV) භාවිතයෙන් තොග අගය කිරීමක් සිදු නොකරන ලදි. මන්ද වසර තුළ සමාගම වෙළඳපොළ වටිනාකමට වඩා අඩු මිලකට නිෂ්පාදන අලෙවි නොකරන ලද බැවිනි. තොග පිරිවැයට තොග අත්පත් කර ගැනීමේදී සිදු වූ වියදම්, නිෂ්පාදන හෝ පරිවර්තන පිරිවැය සහ ඒවා පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා සිදු වූ වෙනත් පිරිවැය ඇතුළත් වේ. සමාගම ප්‍රධාන කාර්යාලයේ සහ විකුණුම් මධ්‍යස්ථානවල අමුද්‍රව්‍ය සහ සම්පූර්ණ භාණ්ඩ අගය කිරීම සඳහා අනුපිළිවෙලගත ක්‍රම (FIFO) සූත්‍රය භාවිතා කරයි.

3.1.1.10 වෙළඳමය ලැබිය යුතු දෑ

සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා ගැනීමට කොන්ත්‍රාත් අයිතියක් ඇති විටදී පමණක්, සංස්ථාව එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳමය ලැබිය යුතු දෑ මූල්‍ය වත්කම් ලෙස පිළිගනී. වෙළඳමය ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේදී අලෙවි කරන ලද භාණ්ඩ හෝ සිදු කරන ලද සේවා සඳහා පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු මුදල් වේ. එකතු කිරීම වසරකට හෝ ඊට අඩු කාලයක් තුළ (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ) අපේක්ෂා කරන්නේ නම් ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

වෙළඳමය ලැබීමට ඇති දෑ අපේක්ෂිත උපලබ්ධි වටිනාකමකින් ඉදිරියට ගෙන යනු ලබන අතර වසර අවසානයේ දී ඉතිරිව පවතින සියලුම මුදල් සමාලෝචනයකින් පසු වසරකට වඩා වැඩි කාලයක් ඉතිරිව පවතින කාලය සැලකිල්ලට ගනිමින් ලැබීමට ඇති අඩමාන මුදල් සඳහා ඇස්තමේන්තු සාදනු ලැබේ. හඳුනා ගන්නා වසර තුළදී නරක්වූ ණය කපා හරිනු ලැබේ.

සංස්ථාවට මුල් කොන්ත්‍රාත් අයිතියේ නියමයන්ට අනුකූලව ගෙවිය යුතු සියලුම මුදල් එකතු කර ගැනීමට නොහැකි වනු ඇති බවට වෛෂයික සාක්ෂි ඇති විටදී වෙළඳමය ලැබිය යුතු දෑ ආශ්‍රිත හානි සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කෙරේ.

3.1.1.11 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අර්ථ දක්වා ඇත්තේ අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන අධි ද්‍රවශීලතා ආයෝජන ලෙසයි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණු සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතේ ඇති මුදල්, ඉතිරිව පවතින බැංකු අයිරා ගැනීම්වලින් ශුද්ධ වූ බැංකුවල තැන්පතු වශයෙනි.

3.2 බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් යනු ඉල්ලුම මත හෝ වාර්තා කරන දිනයෙන් වසරක් ඇතුළත ගෙවීම සඳහා නියමිත ඒවා වේ. ජංගම නොවන බැරකම් යනු වාර්තා කරන දිනයෙන් වසරකට පසු ගෙවීම සඳහා නියමිත ඒවා වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියලුම දැන සිටින බැරකම් ගණන් බලා ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි වර්තමාන නීතිමය හෝ ධනාත්මක බැඳීමක් තිබේ නම් සහ එම බැඳීම සමථයකට පත් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභයක් බැහැර ගලනය අවශ්‍ය වීමට ඉඩ ඇති නම් ප්‍රතිපාදනයක් හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී සියලුම දන්නා ප්‍රතිපාදන ගණන් බලා ඇත.

3.2.1 මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු දායකත්වයන්

සමුච්චිත අරමුදලට ස්ථාවර වත්කම් මූල්‍යකරණය සම්බන්ධයෙන් රජයෙන් ලැබුණු සියලුම මුදල්වල එකතුව ඇතුළත් වේ.

3.2.2 ණය ගැනීම්

ණය මුලින් දරන ලද ගනුදෙනු පිරිවැයෙන් ශුද්ධ වූ සාධාරණ වටිනාකමකින් හඳුනාගනු ලබයි. ණය පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙන යනු ලැබේ; ආදායම (ගනුදෙනු පිරිවැය අඩු කර) සහ මිලදී ගැනීමේ වටිනාකම අතර වෙනස සඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ණය කාලය පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. කෙසේ වෙතත්, වාර්තාකරන දිනය වන විට ණය නොපවතී.

3.2.3 සේවක ප්‍රතිලාභ

(අ) නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම

නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම මඟින් සේවකයෙකුට විශ්‍රාම ගැනීමේදී ලැබෙන ප්‍රතිලාභයක් නිර්වචනය කරනු ලබන අතර, එය සාමාන්‍යයෙන් වයස, සේවය කළ වසර ගණන සහ වන්දි වැනි එක් සාධකයක් වැඩි සාධක ගණනාවක් මත රඳා පවතී.

සංස්ථාව විසින් සියලුම සුදුසුකම් ලත් සේවකයින් සඳහා 1983 අංක 12 දරන ප්‍රසාද දීමනා ගෙවීමේ පනතට අනුව අවශ්‍ය නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්මක් භාවිතා කර ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් බැරකම තුළ නිර්වචනය කළ ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් වාර්තාකරන දිනයේ නිර්වචනය කළ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම සමඟ හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සඳහා ගැලපුම් ද ඇතුළත් වේ. නිර්වචනය කළ ප්‍රතිලාභ බැඳීම සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - සේවක ප්‍රතිලාභ හි නියම කර ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ; නිර්වචනය කළ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් වර්ගයෙන් නම් කර ඇති රජයේ බැඳුම්කරවල පොලී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙන් වන අතර, ඒවාට සම්බන්ධ විශ්‍රාම වැටුප් බැරකමේ කොන්දේසිවලට සමාන පරිණත වීමේ කාල සීමාවන් පවතී.

අත්දැකීම් ගැලපුම් සහ ආයුගණක උපකල්පන වෙනස්වීම්වලින් පැන නගින ලාභ සහ පාඩු ඒවා පැන නගින කාල සීමාව තුළ අනෙකුත් විස්තීර්ණ ආදායම්වලට අය කරනු හෝ බැර කරනු ලැබේ.

සැලැස්මේ වෙනස්වීම් සේවකයින් නිශ්චිත කාල සීමාවක් සේවයේ රැඳී සිටීම යන කොන්දේසිය මත රඳා පවතින්නේ නම් විනා (අයිතිය ලැබීමේ කාලය) අතීත සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වහාම හඳුනාගනු ලැබේ. මේ අවස්ථාවෙහිදී, අතීත සේවා පිරිවැය අයිතිය ලැබීමේ කාලය පුරා සරල රේඛීය පදනමක් මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

1983 අංක 12 දරන ප්‍රසාද දීමනා ගෙවීමේ පනත යටතේ, සේවකයෙකුට බැරකම මතුවන්නේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පමණි.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 13 හි දක්වා ඇත.

(අ). I

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීම හා සම්බන්ධ උපකල්පන

වට්ටම් අනුපාතය 11% කි	වැටුප් වර්ධක අනුපාතය 2% කි
කාර්ය මණ්ඩල පිරිවැටුම 9.66% කි	විශ්‍රාම වයස අවුරුදු 60 කි

.

(ආ) නිර්වචනය කළ දායකත්ව සැලැස්ම – සේ.අ.අ. සහ සේ.හා.අ.

සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) දායකත්වය සඳහා සුදුසුකම් ලත් සියලුම සේවකයින් අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුව අදාළ දායකත්ව අරමුදල් මගින් ආවරණය වේ.

සේවකයින් ආවරණය කරන සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල එය ක්‍රියාත්මක කාලය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

3.2.4 රජයේ ප්‍රදාන

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇති අතර ආශ්‍රිත සියලුම කොන්දේසිවලට අනුකූල වන බවට සහතිකයක් ඇති විට රජයේ ප්‍රදාන හඳුනාගනු ලැබේ. ප්‍රදානය වත්කමක් හා සම්බන්ධ වන විට, ප්‍රදානය වත්කමේ අන්තර්ගත මුදල ලබා ගැනීමේදී අඩු කරනු ලැබේ. ප්‍රදාන වියදම් අයිතමයක් හා සම්බන්ධ වන විට, එය වන්දි ගෙවීමට අදහස් කරන පිරිවැයවලට ක්‍රමානුකූල පදනමක් මත ප්‍රදානය ගැලපීම සඳහා අවශ්‍ය කාලය පුරා ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

3.2.5 වෙළඳමය ගෙවිය යුතු දෑ

සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමට ගිවිසුම්ගත බැඳීමක් ඇති විට පමණක් සංස්ථාව තම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ ගෙවිය යුතු මුදල් මූල්‍ය බැරකම් ලෙස හඳුනාගනී.
වෙළඳ ගෙවිය යුතු දෑ යනු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය ව්‍යාපාර පිළිවෙතේදී ලබා ගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට ඇති බැඳීම් වේ. ගෙවීම වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රයේදී) ලැබීමට නියමිතව ඇත්තේ නම් ගෙවිය යුතු මුදල් වත්මන් බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර, ලැබිය යුතු කාලය වඩාත් දිගු නම්, ඒවා දිගුකාලීන බැරකම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ ගෙවිය යුතු දෑ මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගනු ලැබේ.

3.2.6 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිත වියදම්

අවිනිශ්චිත වියදම් යනු අතීත සිදුවීමකින් පැන නැගිය හැකි වත්කම් හෝ බැඳීම් වන අතර ඒවා සමාගමේ පාලනයෙන් ඔබ්බට වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ නොවීම මත පමණක් තහවුරු වනු ඇත.

සියලුම ද්‍රව්‍යමය ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිත වියදම් සටහන 30 හි හෙළි කර ඇත.

3.3 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ වියදම්වල කාර්ය ක්‍රමය සමාගමේ කාර්ය සාධනයේ අංග සාධාරණව ඉදිරිපත් කරන බවයි, එබැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ විධිවිධානවලට අනුකූලව එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් භාවිතා කරනු ලැබේ.

3.3.1 ආදායම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා එන බවට සහ ආදායම විශ්වසනීය ලෙස මැනිය හැකි බවට පවත්නා අවකාශ මට්ටමට අනුව ගෙවීම් කරනු ලබන්නේ කවදාද යන්න නොතකා ආදායම හඳුනාගනු ලැබේ. බදු හැර ගිවිසුම්ගතව නිර්වචනය කළ ගෙවීම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය හැකි සලකා බැලීමේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලබයි. ආදායම හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනාගැනීමේ නිර්ණායක ද සපුරා තිබිය යුතුය.

(අ) භාණ්ඩ අලෙවිය
භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදා හැරීමේදී භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට ලැබී ඇති විට වේ.

(ආ) සේවා සැපයීම
සේවා සැපයීමේ ආදායම හඳුනාගනු ලබන්නේ සේවාවන් සපයනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන ගිණුම්කරණ කාලය තුළ වේ.

(ඇ) පොලී ආදායම
පොලී ආදායම සඵලදායී පොලී ක්‍රමය මත හඳුනාගනු ලැබේ.

(ඈ) අනෙකුත් ආදායම
අනෙකුත් ආදායම උපචිත පදනමක් මත හඳුනාගනු ලැබේ.

(ඉ) දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම
දේපල, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලැබෙන ලාභය / (අලාභය) අලෙවිය සිදුවන සහ බෙදා හැරීමේ නියෝගය නිකුත් කරන කාලය තුළ හඳුනාගනු ලැබේ.

3.3.2 වියදම් හඳුනාගැනීම

(අ) ආදායම් වියදම
වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන්නේ සිදුවූ වියදම සහ විශේෂිත ආදායම් අයිතම ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයක් පදනම් කරගෙනය. ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමතා තත්ත්වයේ නඩත්තු කිරීමේදී සිදුවන සියලුම වියදම්, වර්ෂය සඳහා ලාභය හෝ පාඩුව ලබා ගැනීමේදී ආදායමට අය කර ඇත.

(ආ) ප්‍රාග්ධන වියදම
ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් තුලිත කිරීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා හෝ ව්‍යාපාරයේ ධාරිතාව වැඩි කිරීමේ අරමුණ සඳහා සිදුකරන වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

(ඇ) ශුද්ධ මූල්‍ය ආදායම / වියදම්
මූල්‍ය ආදායමට ආයෝජනය කළ අරමුදල් සහ කාර්ය මණ්ඩල ණය මත පොලී ආදායම සහ ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකමේ වෙනස්කම් ඇතුළත් වේ. පොලී ආදායම සඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් ලාභ හා අලාභ තුළ එය උපචිත වන විට හඳුනාගනු ලැබේ.

මූල්‍ය පිරිවැයට ණය මත පොලී වියදම්, ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමින් මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකමේ වෙනස්කම්, මූල්‍ය වත්කම් මත හඳුනාගත් අවප්‍රමාණ පාඩු, සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කර ගැනීමට, ඉදිකිරීමට හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපණය කළ නොහැකි ණය ගැනීමේ පිරිවැය සඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් ලාභ හා අලාභ තුළ හඳුනාගනු ලැබේ.

(ඈ) බදු වියදම
ආදායම් බදු වියදම් තුළට ජංගම සහ විලම්බිත බදු ඇතුළත් වේ. එය සම කොටස් තුළ හඳුනාගනු ලබන විට එය සම කොටස් තුළ සෘජුවම හඳුනාගත් අයිතමයනට අදාළවන තරමට හැර ආදායම් බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

ජංගම බදු

වර්තමාන සහ සංසන්දනාත්මක කාල සඳහා ජංගම බදු වියදම මනිනු ලබන්නේ වාර්තාකරන දිනය වන විට ක්‍රියාත්මක කරන ලද හෝ සාරභූතව ක්‍රියාත්මක කරන ලද පසුකාලීන නීති මගින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කළ අදාළ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවූ හෝ ගෙවීමට අපේක්ෂිත මුදල අනුව වේ.

සංරචකය	2024
බදු අනුපාතය	30%

විලම්බිත බදුකරණය

විලම්බිත බදු හඳුනාගනු ලබන්නේ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ බැරකම්වල පවත්නා මුදල් සහ බදු අරමුණු සඳහා භාවිතා කරන මුදල් අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් ශේෂ පත්‍ර බැරකම් ක්‍රමය භාවිතයෙන් වේ.

පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනාගනු නොලැබේ: ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් නොවන සහ ගිණුම්කරණ හෝ බදු අය කළ හැකි ලාභයට හෝ පාඩුවට කිසි ලෙසකිනුදු බලපාන්නේ නැති ගනුදෙනුවක වත්කම් හෝ බැරකම්වල මූලික හඳුනාගැනීම, සහ ඒවා නුදුරු අනාගතයේදී ආපසු හැරවීමට ඉඩ නොමැති තරමට අනු සමාගම් සහ ඒකාබද්ධව පාලනය කරන ලද ආයතනවල ආයෝජන සම්බන්ධ වෙනස්කම් වේ. ඊට අමතරව, යහ අභිලාශයක් මූලික හඳුනාගැනීමේදී පැන නගින බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනාගනු නොලැබේ.

විලම්බිත බදු මනිනු ලබන්නේ වාර්තා කරන දිනය වන විට ක්‍රියාත්මක කරන ලද හෝ සාරභූතව ක්‍රියාත්මක කරන ලද නීති පදනම් කරගෙන, තාවකාලික වෙනස්කම් අවලංගු කරවන විට ඒවාට යොදනු ඇතැයි අපේක්ෂිත බදු අනුපාත අනුව වේ. භාවිතා නොකළ බදු අලාභ, බදු බැරකම් සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කමක් හඳුනාගනු ලබන්නේ, ඒවා ආශ්‍රිතව භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභ පැවතීමට ඉඩ ඇති තරමට වේ. විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරන දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභය සාක්ෂාත් කරගැනීමේ හැකියාවක් තවදුරටත් නොමැති තරමට එය අඩු කරනු ලැබේ.

ජංගම බදු බැරකම් ආශ්‍රිතව ජංගම බදු වත්කම් සකස් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් පවතී නම් සහ විලම්බිත බදු එකම බදු අය කළ හැකි ආයතනයට සහ එකම බදු අධිකාරියට සම්බන්ධ වන විට විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු බැරකම් සමතුලනය කරනු ලැබේ.

අදාළ විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන 18 සහ 30 හි හෙළි කර ඇත.

3.4 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

මිලක් අය කරන්නේ නැද්ද යන්න නොතකා, මූල්‍ය සහ ක්‍රියාකාරී ප්‍රතිපත්ති / තීරණවලට එක් පාර්ශ්වයකට පාලනය කිරීමට හෝ සැලකිය යුතු බලපෑමක් කිරීමට හැකියාව ඇති ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

සම්බන්ධිත ආයතන සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ කිසිදු සම්බන්ධිත ආයතනයක් නොමැත.

3.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය "වක්‍ර ක්‍රමය" භාවිතයෙන් සකස් කර ඇත.

3.6 කොටසකට ඉපැයීම්

සමාගම තම සාමාන්‍ය කොටස් සඳහා මූලික කොටසකට ඉපැයීම් (EPS) දත්ත ඉදිරිපත් කරයි. මූලික කොටසකට ඉපැයීම් ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය හෝ පාඩුව එම කාල සීමාව තුළ පවතින සාමාන්‍ය කොටස්වල බර කළ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙනි.

3.7 වාර්තාකරන දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරන දිනයෙන් පසු සිදුවීම් යනු වාර්තාකරන කාල සීමාව අවසානය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම් වේ.

එම සිදුවීම් සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හි සුදුසු ගැලපුම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන වාර්තාකරන දිනයෙන් පසු සිදුවන කිසිදු සිදුවීමක් නොමැත.

3.8 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා වගකිව යුතුය. වංචාවක් හෝ දෝෂයක් නිසා වේවා, ද්‍රව්‍යමය වැරදි ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යෙදීම සහ පවත්නා තත්ත්වයන් තුළ සාධාරණ වන ගිණුම්කරණ ඇස්තමේන්තු සලකුණු කිරීම මෙම වගකීමට ඇතුළත් වේ.

3.9 සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 24 (සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්) හි සම්බන්ධිත පාර්ශ්ව ලෙස නිර්වචනය කර ඇති පාර්ශ්ව සමඟ ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රමයේදී සංස්ථාව ගනුදෙනු ප්‍රකාශ කළ අතර, එහි විස්තර පහත පරිදි වේ.

පාරිශ්‍රමික (රු.)	1612 ජී.සී. කරුණාරත්න මිය, සභාපතිනි	1589 අනුර ඇතුලත්මුදලි මහතා, හිටපු සභාපති	1613 එම්.ජේ. මාරසිංහ මහතා, කළමනාකරණ අධ්‍යක්ෂ	1541 පී. එල්.ජී. එස්. කාංචන මහතා, හිටපු කළමනාකරණ අධ්‍යක්ෂ	1500 පී.ඩී. ධම්මික මහතා, සාමාන්‍යාධිකාරී	1131ක ෙ.ඩී. එම්.ඒ. චන්ද්‍රසේකර මහතා, සහකාර සාමාන්‍යාධිකාරී, කර්මාන්තශාලා	1292 කේ. පතිරවසම් මහතා, සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - වැ/බ.	1431 එම්.ටී.ඒ. විජේසිංහ මහත්මිය, සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) - වැ/බ.	1459 එච්. එම්.ඩී.ඩී. දනන්ජය මහතා, සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) - වැ./බ.
මූලික වැටුප	128,000	800,000	121,333	650,000	1,210,740	195,120	845,120	491,400	541,958
ජීවන වියදම් දීමනාව	-	593	-	-	198,600	25,600	198,600	142,400	160,200
අයවැය දීමනාව	8,000	50,000	9,333	50,000	96,000	10,000	60,000	40,000	45,000
වෘත්තීය දීමනාව	-	-	-	-	-	30,000	109,166	40,000	31,000
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථා දීමනාව	6,000	60,000	6,000	60,000	69,000	12,000	72,000	48,000	54,000
ඉන්ධන දීමනාව	66,091	483,075	77,034	487,135	1,203,925	184,755	60,000	-	-
දුරකථන දීමනාව	9,600	60,000	11,200	60,000	51,000	7,500	24,000	16,000	18,000
විශේෂ දීමනාව/ වැ.බ. දීමනාව	-	-	-	-	-	13,620	245,010	166,742	187,160
දිරි දීමනා (නිෂ්පාදන හා පැමිණීමේ)	29,175	202,275	29,175	202,275	245,056	37,975	243,116	154,945	189,070
	246,866	**1,655,943**	**254,075**	**1,509,410**	**3,074,321**	**516,570**	**1,857,012**	**1,099,487**	**1,226,388**

ඉහත සඳහන් ප්‍රමාණයන් හැර සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ විසින් මෙවන විට සමාගම් වාහනයක්, රියැදුරකු සහ අතිරේක ඉන්ධන වියදම්ද ලබාගනී.

දිගු කාලීන ප්‍රතිලාභ

සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ හැර ඉහළ කළමනාකාරිත්වය වෙත පාරිතෝෂික ලබාගැනීමේ අවසරය ලබාදී ඇත.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2024 මූල්‍ය ප්‍රකාශන සටහන්

සටහන 04 - දේපළ, පිරියත හා උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍රෝපකරණ	ජල සම්පාදන උපකරණ	රසායනාගාර උපකරණ	කාර්යාලයීය උපකරණ	මෝටර් වාහන	මෙවලම් හා උපකරණ	සමස්ත වත්කම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය									
2024 ජනවාරි 1 දිනට ශේෂය	**636,000,000**	**466,188,397**	**162,021,341**	**16,526,742**	**1,068,274**	**45,578,696**	**59,736,967**	**9,654,125**	**1,396,774,542**
එකතු කිරීම්	-	11,787,478	15,553,479	68,894	1,242,337	15,134,320	-	987,262	44,773,770.07
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**636,000,000**	**477,975,875**	**177,574,820**	**16,595,636**	**2,310,612**	**60,713,016**	**59,736,967**	**10,641,387**	**1,441,548,312**
සමුච්චිත ක්ෂයවීම්									
2024 ජනවාරි 1 දිනට ශේෂය	**-**	**134,313,832**	**121,605,056**	**16,079,686**	**795,711**	**20,487,190**	**16,137,164**	**6,794,730**	**316,213,369**
2024 වසරට වෙනස් වීම්	-	23,641,918	13,911,539	221,551	93,709	5,197,383	11,947,393	1,725,073	56,738,566.28
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**157,955,750**	**135,516,595**	**16,301,237**	**889,420**	**25,684,573**	**28,084,558**	**8,519,803**	**372,951,935**
2023 දෙසැම්බර් 31 දිනට පවත්නා වටිනාකම	636,000,000	331,874,565	40,416,285	447,055	272,564	25,091,506	43,599,803	2,859,395	1,080,561,174
2024 දෙසැම්බර් 31 දිනට පවත්නා වටිනාකම	**636,000,000**	**320,020,125**	**42,058,225**	**294,399**	**1,421,192**	**35,028,443**	**31,652,409**	**2,121,584**	**1,068,596,377**

සටහන 01 :අප ආයතනය විසින් පහත සඳහන් ඔසු උයන් වගා කොට ඇති නමුදු මේ දක්වාද හිමිකාරිත්වය පවරා නොමැත.

නිකවැරටිය ඔසු උයන

දංගොල්ල ඔසු උයන

මැදවච්චිය ඔසු උයන

සටහන 02: කළමනාකාරිත්වයේ තීරණයකට අනුව 2022 වසර තුළ වාහන නවයක් නැවත ඇගයුම් නොකරන ලදි. නැවත ඇගයුම් නොකරන ලද වාහන අංක: 32-3256 , 150-1601, 26 ශ්‍රී 7911 , 67-1213 , RV-9467 , ට්‍රෙලරය සහිත බව්සරය -738452 , ට්‍රෙලරය සහිත බව්සරය 738453, ට්‍රෙලරය සහ බව්සරය.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන් - 2024

දිනට,	**2024.12.31**	2023.12.31	2022.12.31
	රු.	රු.	රු.
සටහන 05 - සිදු කෙරෙමින් පවත්නා කටයුතු			
පතිරගොඩ නව ගබඩා සංකීර්ණය	**12,144,410**	12,144,410	12,144,410
සෙසු සිදු කෙරෙමින් පවත්නා කටයුතුවලට අදාළ වියදම්	**-**	633,966	4,292,111
	12,144,410	12,778,376	16,436,521
සටහන 06 - කාර්ය මණ්ඩල ණය			
06.1- සේවකයන් වෙත නිකුත් කරන ලද ණය	**රු.**	රු.	රු.
වසර ආරම්භයේ ශේෂය	**30,871,411**	33,413,306	27,941,063
වසර තුළ ලබාදුන් ණය	**19,410,172**	19,750,000	24,852,195
වසර තුළ අයකරගත් ණය	**21,442,159**	22,291,895	19,629,951
	28,839,423	30,871,411	33,413,306
පෙර ගෙවන ලද කාර්ය මණ්ඩල ප්‍රතිලාභ වෙත මාරු කිරීම්	**(1,510,665)**	(1,617,104)	-
වසර අවසානයේ ශේෂය	**27,328,758**	29,254,307	33,413,306
06.2-පෙර ගෙවන ලද කාර්ය මණ්ඩල ප්‍රතිලාභ			
වසර ආරම්භයේ ශේෂය	**1,617,104**	-	-
වසර තුළ එකතු වීම්	**2,768,304**	4,156,127	-
ක්‍රමක්ෂය	**(2,874,744)**	(2,539,023)	-
වසර අවසානයේ ශේෂය	**1,510,665**	1,617,104	-
06.අ-ජංගම නොවන වත්කම්			
සේවකයන් වෙත ලබාදුන් ණය	**11,650,611**	12,458,336	-
පෙර ගෙවන ලද කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	**176,453**	188,885	-
	11,827,064	12,647,221	-
06.ආ -ජංගම වත්කම්			
සේවකයන් වෙත ලබාදුන් ණය	**15,678,147**	16,795,970	-
පෙර ගෙවන ලද කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	**1,334,212**	1,428,219	-
	17,012,359	18,224,190	-
එකතුව	**28,839,423**	30,871,411	33,413,306

සංස්ථාව සේවකයින්ට සහනදායී අනුපාත යටතේ ණය ලබා දෙයි. මෙම ණය 2 මට්ටමේ යෙදවුම් භාවිතයෙන් මූලික හඳුනාගැනීමේදී සාධාරණ වටිනාකමක් ලබා දෙනු ලැබේ. සේවක ණයවල සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන්නේ සමාන ණය සඳහා වෙළඳපොළ ආශ්‍රිත අනුපාත භාවිතා කරමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙනි.

සේවක ණයවල පිරිවැය සහ සාධාරණ වටිනාකම අතර වෙනස පෙරගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ලෙස පිළිගැනේ. සේවක ණය ණය සහ ලැබිය යුතු දේ ලෙස වර්ගීකරණය කර ඇති අතර පසුව ක්‍රමක්ෂ පිරිවැය අනුව මනිනු ලැබේ. සේවකයින්ට ලබා දෙන ණය සුරක්ෂිත කර ඇති අතර පහත සඳහන් අනුපාත යටතේ පොලිය අය කෙරේ.

	ආපදා	ආපදා	ආපදා
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	**4.2%**	4.2%	4.2%
වෙළඳපල පොළී අනුපාතය	**12%**	12%	12%

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන් - 2024

මෙදිනට,		**2024.12.31**	2023.12.31	2022.12.31
		රු.	රු.	රු.
සටහන 07 - භාණ්ඩ තොග				
අමුද්‍රව්‍ය තොගය		**123,885,566**	97,935,062	96,004,550
නිමි ඖෂධ තොගය		**262,641,057**	452,862,514	151,251,372
ඇසුරුම් ද්‍රව්‍ය		**36,914,549**	28,099,379	39,356,268
සිදු කෙරෙමින් පවත්නා කටයුතු		**21,645,286**	21,234,120	20,691,648
ලිපිද්‍රව්‍ය තොගය		**1,917,277**	2,305,647	1,546,884
ගබඩාව 13- වෙනත් තොග		**2,425,605**	2,558,727	7,359,738
දැවිතෙල් තොගය		**1,407,600**	1,624,950	2,568,000
යන්ත්‍රෝපකරණ අමතර කොටස් තොගය		**5,025,291**	6,177,893	2,490,087
		455,862,230	612,798,291	321,268,547
		රු.	රු.	රු.
සටහන 08 - විවිධ තැන්පතු				
අලෙවි මධ්‍යස්ථාන කුලී තැන්පතු	**8.1**	**2,081,000**	2,441,000	1,781,000
ගබඩා කුලී තැන්පතු	**8.2**	**292,500**	292,500	517,500
දුරකථන තැන්පතු		**26,765**	26,765	26,765
ඉන්ධන තැන්පතු	**8.3**	**700,000**	700,000	700,000
නීති තැන්පතු	**8.4**	**262,000**	262,000	262,000
වෙනත් තැන්පතු	**8.5**	**10,500**	10,500	10,500
විදුලි තැන්පතු		**24,000**	24,000	24,000
		3,396,765	3,756,765	3,321,765
		රු.	රු.	රු.
සටහන 08.1 - අලෙවි මධ්‍යස්ථාන කුලී තැන්පතු				
ගාල්ල අලෙවි මධ්‍යස්ථානය		**195,000**	195,000	195,000
මොණරාගල පෝෂණ මන්දිරය -(COA)		**36,000**	36,000	36,000
ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය		**330,000**	330,000	330,000
කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය		**1,040,000**	1,040,000	1,040,000
මහනුවර අලෙවි මධ්‍යස්ථානය		**180,000**	180,000	180,000
අනුරාධපුර අලෙවි මධ්‍යස්ථානය		**300,000**	660,000	-
		2,081,000	2,441,000	1,781,000
		රු.	රු.	රු.
සටහන 08.2 - ගබඩා කුලී තැන්පතු				
අංක.007 ගබඩාව- චමින්ද ජයනාත් මහතා		**100,000**	100,000	100,000
අංක.006 ගබඩාව- ජී.ටී. ප්‍රේමවතී මහත්මිය		**96,500**	96,500	96,500
මොණරාගල රැස්කිරීමේ මධ්‍යස්ථානය - එම්.ජී.ඒ. (		-	-	225,000
බෙරුවල අලෙවි මධ්‍යස්ථානය - බෙරුවල විවිධ සේවා සමූපකාර සමිතිය		**96,000**	96,000	96,000
		292,500	292,500	517,500

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන් - 2024

මෙදිනට,	**2024.12.31**	2023.12.31	2022.12.31
	රු.	රු.	රු.
සටහන 08.3 - ඉන්ධන තැන්පතු			
මහරගම විවිධසේවා සමුපකාර සමිති සමාගම	**300,000**	300,000	300,000
සමුපකාර පුද්ගලික සමාගම - අනුරාධපුර	**50,000**	50,000	50,000
සී/ස. සමුපකාර සමිතිය - නිකවැරටිය	**150,000**	150,000	150,000
මහරගම ඔටෝ කෙයාර් සෙන්ටර්	**200,000**	200,000	200,000
	700,000	700,000	700,000
	රු.	රු.	රු.
සටහන 08.4 -නීති තැන්පතු			
දිසා අධිකරණය - කොළඹ	**252,000**	252,000	252,000
පෝල් ඇන්ඩ් රත්නායක සමාගම	**10,000**	10,000	10,000
	262,000	262,000	262,000
	රු.	රු.	රු.
සටහන 08.5 -සෙසු තැන්පතු			
ලංක විදුලිබල මණ්ඩලය (අලෙවි මධ්‍යස්ථානය - යාපනය)	**1,500**	1,500	1,500
ලංක විදුලිබල මණ්ඩලය (අලෙවි මධ්‍යස්ථානය - මොණරාගල)	**1,500**	1,500	1,500
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	**2,500**	2,500	2,500
ලංකා විදුලිබල මණ්ඩලය (පාවෙන වෙළඳපල)	**3,000**	3,000	3,000
ලංකා විදුලිබල මණ්ඩලය (දුම්රියපල)	**2,000**	2,000	2,000
	10,500	10,500	10,500
	රු.	රු.	රු.
සටහන 09- ස්ථාවර තැන්පතු ස්වරූපයේ කෙටි කාලීන ආයෝජන			
මහජන බැංකුව-097-6001-000258857	**25,000,000**	25,000,000	-
මහජන බැංකුව-097-6001-000258795	**25,000,000**	25,000,000	-
මහජන බැංකුව-097-6001-000258802	**32,000,000**	32,000,000	-
මහජන බැංකුව-097-6001-000272760	**75,000,000**	-	-
ලංකා බැංකුව-89224367 (**සටහන 09.1**)	**33,065,223**	30,189,375	27,589,075
මහජන බැංකුව-097-6001-0000057253	-	-	2,735,886
මහජන බැංකුව-097-6001-000210783	-	-	55,239,726
මහජන බැංකුව-097-6001-000218455	-	-	26,567,123
	190,065,223	112,189,375	112,131,811

සටහන 09.1-ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුව (ගි.අ.-89224367) පාරිතෝෂික අවශ්‍යතා සඳහා තබාගෙන ඇත

	රු.	රු.	රු.
සටහන 10 - වෙළඳ ණයකරුවෝ			
වෙළඳ ණයකරුවෝ	**190,623,982**	83,680,320	148,120,041
අඩුකළා - නරක්වූ සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන	**2,827,001**	2,507,072	2,516,204
	187,796,981	81,173,248	145,603,836

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සටහන් - 2024

මෙදිනට,		**2024.12.31**	2023.12.31	2022.12.31
		රු.	රු.	රු.
සටහන 11 - පෙර ගෙවුම් සහ අත්තිකාරම්				
පොදු අත්තිකාරම්	**11.1**	**297,059**	292,171	169,408
කුලී අත්තිකාරම්		**271,126**	271,126	271,126
ලැබිය යුතු අලෙවි ආදායම	**11.2**	**2,088,082**	72,782	55,800
සුළු මුදල් අත්තිකාරම්		**139,991**	115,739	76,530
